# <u>2021 අයවැය කථාව</u>

**හැඳින්වීම**

ගරු කථානායකතුමනි,

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව තුළ 2021 – 2023 මැදිකාලීන ආර්ථික පුනර්ජීවන හා දිළිඳුකම පිටුදැකීමේ කඩිනම් වැඩසටහන ශක්තිමත් කරන 2021 අයවැය කතාව මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටකින්.

ගරු කථානායකතුමනි,

අප රට කවර ආර්ථික මට්ටමක සිටියත්, කවර අභියෝගයන්ට මුහුණ දී තිබුණත් පිළිගත යුතු එක් මූලික යතාර්ථයක් වන්නේ කාර්මීකරණයෙන් ඉදිරියට පැමිණි ලෝක ආර්ථිකය, මේ වන විට තාක්ෂණික ආර්ථිකයට පිවිස ඇති බවයි. අප මෙය දැකිය යුත්තේ කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශ සංවර්ධනය සඳහා සම්ප්‍රදායික උපාය මාර්ගවලින් ඔබ්බට ගොස් තාක්ෂණික වශයෙන් මෙම ක්ෂේත්‍ර ඒකාබද්ධ නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලියට යොමු කිරිමට ප්‍රමුඛත්වය දිය යුතු අවස්ථාවක් ලෙසයි. අපේ රටේ ආර්ථික සංවර්ධනයේදී අප කළ යුත්තේ ජෛව විවිධත්වයෙන් පොහොසත්, සංස්කෘතිමය වශයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇති ජාතික උරුම දායාදයන්ගෙන් පෝෂණය වූ සුවිශේෂිත අනන්‍යතාවක් ඇති පරිසර සංවේදී, තිරසාර සංවර්ධනයට කැප වූ රටක් හා ජාතියක් ලෙස ඉස්මතු කිරීමයි. සතා, සිව්පාවුන්, ගංගා, ඇළ දොළ හා ස්වභාව සෞන්දර්යෙන් පෝෂණය වු, අපේ දිවයින එයටත් වඩා කිහිප ගුණයකින් විශාල වූ සාගර සම්පතකටද උරුමකම් කියන රටක් ලෙස, ජාතික නිෂ්පාදන ක්‍රියාවලියේ සාපේක්ෂ වාසි (Comparative Advantage) මතු කළ යුතුයි.

ගරු කථානායකතුමනි,

භූ දේශපාලනික වශයෙන්ද අප රටේ වැදගත්කම සෑම රටකටම දැනෙන යුගයකට අප ප්‍රවේශ වී සිටිනවා. අපේ අසල්වැසි ඉන්දියාව ඉදිරි දශක කිහිපය තුළ ලෝකයේ ප්‍රබල ආර්ථිකයක්. ඊට අමතරව චීනය ඇතුළු ආසියා රටවල් කිහිපයක්ද ලෝක ආර්ථිකයේ ප්‍රබල ආර්ථිකයන් 5 අතරට පිවිසෙන බව මගේ විශ්වාසයයි.

ඉහළ ආදායම් වර්ධනයක් ඇති අප අවට ආසියා වෙළඳපළ ලෝක ජනගහනයෙන් සියයට 60ක් පමණ වෙසෙන නැගී එන ආර්ථික කලාපයක්. සම්ප්‍රදායික බටහිර දියුණු ආර්ථිකයන්ට මෙන්ම නැගී එන ප්‍රබල ආර්ථිකයන්ගේද කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස රටේ ස්වෛරීත්වය රැකගනිමින් උපරිම ප්‍රයෝජනය ගැනීමට දිගුකාලීන උපාය මාර්ගික දැක්මක් තිබිය යුතුයි. අප රටේ දේශීය ආර්ථික ඉඩ ප්‍රස්ථා පුළුල්වන පරිදි කොළඹ හා හම්බන්තොට වරායන් හා ගුවන් තොටුපොළවල් මෙම වාණිජ ක්‍රියාවලියේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු කළ යුත්තේ  එවැනි ජාතික දැක්මක් තුළයි.

ගරු කතානායකතුමනි,
අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව අමතමින් කළ ප්‍රතිපත්ති ප්‍රකාශන දෙක තුළින්ම අවධාරණය කළ ආර්ථික ප්‍රතිපත්තිය වූයේ “සෞභාග්‍යයේ දැක්ම” තුළින් මේ රටේ ජනතාව අපේක්ෂා කළ සැමට ප්‍රතිලාභ ලැබෙන අපේම ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමයි. ආදායම් හා පළාත් විෂමතාවයන් මෙන්ම නාගරික හා ග්‍රාමීය අසමානතාවයන්ද අවම වන සංවර්ධනයකට යොමු කිරීම එහි අන්තර්ගත හරයයි. අපගේ සමාජ සංවර්ධන වැඩපිළිවෙලේ මූලික අරමුණ වී ඇත්තේ කොවිඩ්-19 ඇතුළු වසංගත රෝග වලින් මෙන්ම  මේ වන විට ඉහළ මට්ටමක ඇති බෝ නොවන රෝග වලින්ද ජනතාව මුදා ගැනෙන පරිදි නිදහස් සෞඛ්‍ය සේවය ජනතාවට තව දුරටත් ඵලදායි වන ලෙස පුළුල් කිරීමයි. සැම දරුවකුටම ඵලදායි පුරවැසියෙක් ලෙස සිය කුසලතාවන් සහ නිපුණතාවන් මතු කරගත හැකි අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමට අප වෙහෙසිය යුත්තේ, මානව සම්පත් ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම දැනුමේ ආර්ථිකයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන නිසයි.

ක්‍රීඩා හිතකාමී ජනසමාජයක් තුළින් බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කරමින් සෞඛ්‍ය සම්පන්න ළමා හා තරුණ පරපුරක් බිහිකිරීම හා සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික පෙර දැක්මකට තාරුණ්‍යයේ ක්‍රියාකාරී දායකත්වය ලබාගත යුතුයි. ඒ සඳහා අධ්‍යාපන හා ක්‍රීඩා, මානව සම්පත් සංවර්ධනයට බද්ධ කළ යුතුයි. රටේ සිටිනා දක්ෂ දරුවන් පිරිස විශ්ව විද්‍යාල දක්වා සාර්ථක ගමන් මගක ගොස් අවසානයේ විරැකියාව උරුම කරගන්නේ නම් එම අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන  ප්‍රතිසංස්කරණ

හඳුන්වාදීමට ප්‍රමුඛත්වය දිය යුතුයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මෙම කාර්යයට යොමුකර තිබෙනවා.

අප සමාජයේ ජීවත්වන අවදානමකට ලක්වූ (vulnerable) පුද්ගලයින්, වැඩිහිටියන්, විවිධ හැකියාවන් ඇති පුද්ගලයන් හා අඩු ආදායම්ලාභීන්ගේ සමාජ සුභසාධනය සහ සමාජ ආරක්ෂණය (social security) අප රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලික වගකීමක් කරගෙන තිබෙනවා. ඒ සඳහා සෞඛ්‍ය, අධ්‍යාපනය, ක්‍රීඩා හා සමාජ සුභසාධනය මානව සම්පත් සංවර්ධනයේ එකිනෙකට වෙන් කළ නොහැකි බව "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තිය තුළින් පැහැදිලි කර තිබෙනවා.

ජනතා අවශ්‍යතාවන් ඉටු කිරීමේදී නවීන සන්නිවේදනය හා තාක්ෂණය අද ප්‍රධාන යටිතල පහසුකම් අවශ්‍යතාවක්. පානීය ජලය, වාරිමාර්ග, විදුලිය, මාර්ග, බැංකු හා මුදල් මේ සඳහා අවශ්‍ය පරිපූරක පහසුකම් වෙනවා. දුෂ්කර ජීවිත ගෙවන ගොවීන්, ධීවරයින්, පාරම්පරික කර්මාන්තවල යෙදෙන්නන්, ස්වයං රැකියාවල යෙදෙන්නන්, යැපුම් ආර්ථිකයට කොටුවී ඇති අඩු ආදායම්ලාභීන් හා විවිධ දුෂ්කරතා නිසා නිශ්චිත ආදායම් නොමැති ජීවනෝපාය අවදානම් තුළ මුදල්, තාක්ෂණය හා වෙළඳපළ සොයාගත නොහැකි කුඩා ව්‍යාපාරිකයන් තුළ ඇත්තේ සැඟවුණ නිෂ්පාදන ධාරිතාවක්. ඔවුන් නිෂ්පාදනයේ ප්‍රබල කොටස්කරුවන් කර ගනිමින්, දිළිඳු බවින් තොර ආර්ථික සංවර්ධනයකට ප්‍රවේශ විය යුත්තේ එම සැඟවුණ ධාරිතාව තුළ පුළුල් නිෂ්පාදන හැකියාවක් ඇති නිසයි.

ගරු කතානායකතුමනි,

හුදෙක් ආනයනය මත රඳාපවතින වෙළඳ ආර්ථිකයක් වෙනුවට ගොවි නිෂ්පාදන හා කෘෂිකාර්මිකරණයක් (Agro Industrialization) මුල්කරගත් නිෂ්පාදන ආර්ථිකයක් ජනතා අපේක්ෂාව බව "ගම සමඟ පිළිසඳරක්" ජනතා සංවාදයෙන් අප තේරුම් ගෙන තිබෙනවා. "සෞභාග්‍යයේ දැක්ම" යනු ස්වභාවික පරිසර සංවේදීව, එය පෝෂණය කරමින් සංවර්ධන කටයුතු පවත්වා ගැනීම බව මෙම උත්තරීතර සභාවේදී අතිගරු ජනාධිපතිතුමා අවධාරණය කළා.

රජයේ කාර්යභාරය ඉටු කිරීමේදී, සංකීර්ණ වූ පරිපාලන හා නියාමන ක්‍රම වෙනුවට බිම් මට්ටමේ කටයුතු වලට මුල්තැන දෙන ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් අවශ්‍ය වී තිබෙන බවද ජනතා සංවාද වලින් අප හඳුනාගෙන තිබෙනවා.

පසුගිය රජය මෙන් රාජ්‍ය සේවය හෙළා නොදැක, එහි හැකියාවන් අවතක්සේරු නොකර, විනිවිදභාවයෙන් යුතුව අවම පිරිවැයකින් හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක විය හැකි රාජ්‍ය සේවයක් නිර්මාණය කළ යුතු වෙනවා. සත්භාවයෙන් රාජ්‍ය සේවය කරන නිළධාරින් දේශපාලන පලිගැනීම් වලට ලක් කිරීම අප හෙළා දැකිය යුතුයි. වසර ගණනාවක් ගතවන නඩු හබ, අකාර්යක්ෂමව හා යල්පැන ගිය නීති පද්ධතීන් හා ආයතනික ව්‍යූහයක අවශ්‍යතාවයද ජනතා හඩ වී තිබෙනවා. එබැවින් පවත්නා නීති හා ආයතනික ව්‍යූහය ප්‍රතිසංස්කරණය කරමින් ජනතාව මෙන්ම ව්‍යාපාරිකයින් දිරිගන්වන පරිසරයක් නිර්මාණය කිරීමටද අප මුල්තැන දිය යුතුයි.

ගරු කතානායකතුමනි,

## රජයේ සාර්ව ආර්ථික ගමන්මග (Macro-Economic Road Map)

"සෞභාග්‍යයේ දැක්ම" සාර්ව ආර්ථික වැඩපිළිවෙළට අනුව සමාජයේ සියළු පාර්ශව වලට ප්‍රතිලාභ ලැබෙන සියයට 6ක් ඉක්මවන මැදිකාලීන ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම අපගේ ඉලක්කය වෙනවා.

මිල ස්ථාවරත්වය ඇති කර ගනිමින්, සියයට 5ක පමණ වාර්ෂික උද්ධමන වේගයක් පවත්වා ගනිමින්, ජීවන වියදම් පාලනයට මුල් තැනක් දිය යුතු වෙනවා. ස්ථාවර පොලී හා විදේශ විනිමය අනුපාත, බදු ප්‍රතිපත්තිය, බැංකු හා මූල්‍ය පහසුකම් හා ආයතනික ක්‍රියාකාරීත්වය, භාණ්ඩ හා සේවා සැපයුම දිරි ගැන්විය යුතුයි. ජනතාවගේ ආර්ථික නිදහස තහවුරු කරමින් නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමට රජය පහසුකම් සපයන ව්‍යූහාත්මක වෙනසක් වෙළඳපළ ආර්ථික රාමුව තුළ ඇති කිරීම මෙම වැඩපිළිවෙළේ ප්‍රධාන උපාය මාර්ග වෙනවා.

රජයේ ආදායම හා වියදම අතර ඇති සියයට 9ක පමණ පරතරය සියයට 4ක මට්ටමකට වාර්ෂිකව අඩුකර ගැනීම අපගේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අරමුණු

අතර ප්‍රධාන සන්ධිස්ථානයක්. ජාතික ආදායමෙන් සියයට 90ක් වන රාජ්‍ය ණය සියයට 70කට අඩු කර ගැනීමත්, විදේශ ණය සංයුතිය තුළ ඇති වී ඇති අවදානම් අඩු කර ගැනීමත්, එම සන්ධිස්ථානයට ලඟාවීම සඳහා අවශ්‍ය වෙනවා. නිෂ්පාදන ක්‍රියාවලිය හා ගනුදෙනු සඳහා ප්‍රමාණවත් පරිදි මුදල් හා ණය පහසුකම් ජනතාවට ගලා යන පරිදි බැංකු හා මූල්‍ය පද්ධතිය ප්‍රතිසංස්කරණය කළ යුතුයි. මුදල් හා ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ නව දැක්මකින් බැලිය යුතු යැයි අප විශ්වාස කරනවා.

දේශීය නිෂ්පාදනවලට, වටිනාකමක් එක් කරනු ලබන අපනයන විවිධාංගිකරණය තුළින් විදේශ ඉපයුම් වැඩි කිරීම අවශ්‍යයි. ආනයන මත වන දැඩි රඳාපැවැත්ම අවම කර ගනිමින් විදේශ වෙළඳාමේ හිඟය අඩු කරගත හැකි පරිදි වෙළඳ හා නිෂ්පාදන ක්‍රියාවලිය හසුරුවා ගත යුතුයි. සංචාරක, විදේශ රැකියා, වරාය හා ගුවන් සේවා ඉපයීම්වල ආදායම් වැඩිකර ගැනීම, වෙළඳ හිඟය අඩු කිරීමට සමගාමීව සිදු කළ යුත්තේ අපගේ විදේශ සම්පත් වැඩි කර ගැනීමට භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම සේවා සැපයුමද ඉහළ මට්ටමක පැවතිය යුතු නිසයි. පුළුල් ග්‍රාමීය සංවර්ධනයක් තුළින් දුප්පත්කම පිටුදැකීම ඉලක්ක කරගත් රැකියා උත්පාදනය හා ජීවනෝපාය මාර්ග වැඩිකිරීම මෙන්ම සෞඛ්‍යය, අධ්‍යාපනය හා සමාජ සුභසාධනය පුළුල් කිරීමේ සංවර්ධන ප්‍රවේශයකට අප පිවිසිය යුත්තේ මෙම සාර්ව ආර්ථික දැක්ම තුළයි.

## විදේශ ණය මුදල් උපයෝජනය

ශ්‍රී ලංකාව විදේශ ණය අරමුදල් මගින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ප්‍රමාණය සීඝ්‍ර ලෙස වැඩි වී තිබෙනවා. එහෙත්, ණය මුදල් යටතේ ඩොලර් මිලියන 6,000කට වඩා වැඩි මුදල් වටිනාකමක් ඇති ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන්නේ නැහැ. ව්‍යාපෘති සැලසුම් කිරීම, ශක්‍යතා අධ්‍යනයන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් හා අධීක්ෂණ කටයුතු වලදී දැකිය හැකි ප්‍රධාන දුර්වලතා වී ඇත්තේ එම වැඩසටහන් දේශීය අවශ්‍යතා වලින් දුරස්ථවීමත්, වැඩසටහන් වියදම් වැඩිවීමත්, ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය වැඩි නිසා, අඩු ප්‍රතිලාභ ඇතිවීමත්ය. එම නිසා විදේශ ණය ප්‍රමාණය මෙන්ම ණය සේවා ඉහළයාමත් දක්නට ලැබෙනවා. එම වියදම් නිසා වඩා ඵලදායි අඩු පිරිවැයකින් කළ හැකි ව්‍යාපෘති සඳහා මුදල් හිඟවීම තුළ

භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතුවලට අහිතකර බලපෑම් ඇතිවන බවද නිරීක්ෂණය වී තිබෙනවා.

ගරු කතානායකතුමනි,

මෙම ණය අරමුදල් "සෞභාග්‍යයේ දැක්ම" ආර්ථික හා සමාජ සංවර්ධන වැඩපිළිවෙළ තුළ හඳුනාගෙන ඇති සුවිශේෂීතා මුල් තැන දෙමින් යලි සකස්කර ගැනීමට අප සැලසුම් කර  තිබෙනවා. ඒ සඳහා සංවර්ධන ණය මුදල් සපයන ආයතන දක්වා ඇති සහය අප අගය කරනවා. පවත්නා ණය යෝජනා ක්‍රම තුළම, ප්‍රමුඛත්වය ගෙන ඇති, කොවිඩ් රෝග නිවාරණ කටයුතු,  පානීය ජල සැපයීම, ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ග්‍රාමීය සෞඛ්‍ය සේවා පුළුල් කිරීම, දරුවන් හා මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය දියුණු කිරීම, වෘත්තීය අධ්‍යාපනයට සිසුන් ආකර්ශණය කිරීමට අප මුල්තැන දී තිබෙනවා. එමෙන්ම, සම්ප්‍රදායික කර්මාන්තවලට නව අගයක් ලබාදීම, තරුණ තරුණියන්ට නව ව්‍යාපාර සඳහා ආරම්භක ප්‍රාග්ධනය සැපයීම හා ගොවිපළ සංවර්ධනයට තාක්ෂණය හඳුන්වාදීම සඳහා මුදල් වෙන් කර ගැනීමට හැකි වී තිබෙනවා.  පුනර්ජනනීය බලශක්ති ධාරිතාව වැඩි කිරීම, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපළ ප්‍රතිසංස්කරණය ආදී ප්‍රමුඛතාවන්ට මුදල් වෙන් කර ගැනීමටත් අප කටයුතු කර තිබෙනවා.

මේ අනුව ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා JICA  ආයතනය සමඟ පමණක් වාර්ෂිකව මෙම කටයුතු සඳහා වියදම් කිරීමට සැලසුම් කර ඇති විදේශ ණය ප්‍රමාණය ඩොලර් මිලියන 1,400ක් පමණ වෙනවා. මෙයට අමතරව, ද්විපාර්ශ්වික සංවර්ධන පරිපූරක ණය මුදල් ඩොලර් මිලියන 400ක් පමණ ලබා ගැනීමටද අපේක්ෂා කරනවා. මෙම ව්‍යාපෘතින් සඳහා  ආනයන අවශ්‍යතා ඉතා අඩු බැවින් විදේශ විනිමය කළමනාකරණයටද මෙම වැඩපිළිවෙළ ධනාත්මක බලපෑමක් ඇති කරනවා. විදේශ ණය, තාක්ෂණ උපකරණ හා විශේෂිත අවශ්‍යතාවන් හැර ප්‍රතිපාදන වලින් සියයට 65ක් පමණ දේශීය වියදම් සඳහා යොදා ගැනීමට අප කටයුතු කරනවා.

ණය මුදල් යටතේ ඇති විවිධ ව්‍යාපෘති කාර්යාල හා විදේශ උපදේශක වියදම් සීමා කර, අදාළ ආයතනවල වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කිරීමෙන් වියදම් අඩු කිරීමටත්, මනා සම්බන්ධීකරණයක් ඇති කිරීමත් අපේක්ෂා කරනවා. ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍රවල

(Development Clusters) ප්‍රතිපත්ති හා උපාය මාර්ග පදනම් කරගෙන විදේශ ආයතන වලින් (Policy Based Borrowings) ණය ලබා ගැනීමට ප්‍රමුඛත්වය දෙනු ලබනවා. දේශීය අරමුදල් හැකිතාක් දුරට ජාතික යටිතල පහසුකම් පද්ධතියට, ග්‍රාමීය ආර්ථිකය විවෘත කළ හැකි පරිදි යොදා ගැනීමද මෙම ආයෝජන මූල්‍යකරණයේ උපාය මාර්ගයක් වෙනවා.

## බදු ප්‍රතිපත්තිය

“සෞභාග්‍යයේ දැක්ම” මගින් ප්‍රකාශිත වූ පරිදි බදු ගෙවන්නන්ගේ පහසුව මෙන්ම බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා ඉතා සරල බදු ක්‍රමයක් රජය විසින් 2020 ජනවාරි මස ක්‍රියාත්මක කළා. එම බදු ක්‍රමය ඉදිරි වසර 5 තුළ නොවෙනස්ව පවත්වා ගැනීම, ව්‍යාපාරික කටයුතු දියුණු කරමින් ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීමට අවශ්‍ය එක් ප්‍රධාන සාධකයක්. බැංකු, මූල්‍ය හා රක්ෂණ ක්ෂේත්‍ර හැර, භාණ්ඩ ආනයනය හා නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා ව්‍යාපාර පිරිවැටුම මසකට රුපියල් මිලියන 25ට වැඩි ව්‍යාපාර වලට අදාළ සියයට 8ක වැට් බද්ද නොවෙනස්ව පවත්වා ගෙන යැමට යෝජනා කරනවා. දැනට විවිධ ආයතන හා නීතිමය විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන මත්පැන්, සිගරට්, දුරකථන සේවා, සූදු (Gaming), මෝටර් රථ වැනි, මුළු බදු ආදායමෙන් සියයට 50කට වැඩි බදු ආදායම් දායකත්වයක් දෙන භාණ්ඩ හා සේවා බදු වඩා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා එක බදු ක්‍රමයක්, online තාක්ෂණය ඔස්සේ කළමනාකරණය කිරීමට සඳහා විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් (Special Goods and Service Tax) හඳුන්වා දීමට යෝජනා කරනවා. සුරාබදු ආඥා පනත වැනි විශේෂ පනත්, නීති විරෝධි මත්පැන් හා දුම්වැටි වෙළඳාම වලක්වා ගැනීමේ නියාමනය ශක්තිමත් කිරීමට හැකි වන පරිදි යොදා ගැනීමෙන් ආදායම් මාර්ග ශක්තිමත් කිරීම මෙම ප්‍රතිසංස්කරණයේ තවත් අරමුණක්.

2020 ජනවාරි මස 01 වන දින සිට සරල බදු ක්‍රමයක් හා online බදු පරිපාලනය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති බැවින් එතෙක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද වැනි බදු වලට අදාල හිඟ බදු, ගෙවන්නන්ගේ මූල්‍යමය හැකියාව පදනම් කරගත්

අවසන් හා පූර්ණ (Full and Final Settlement) විසඳුමක් වශයෙන් සහන බදු ගෙවීමකට යටත්ව අදාළ ලිපි ගොනු වසා දැමීමට යෝජනා කෙරේ.

එමෙන්ම 2021.04.01 දින සිට සියළු සමාගම් ව්‍යාපාර බදු e-filing ක්‍රමයට යටත් කිරීම අනිවාර්ය කිරීමද, බදු හා සෑම ගනුදෙනුවකටම අදාළව බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) යොදා ගැනීමට හැකිවන පරිදි බදු නීතිය සංශෝධනය කරනු ලබනවා. බැංකු හා මූල්‍ය ආයතනවල බදු ගනනය කිරීමේදී අඩමාන ණය හා අපේක්ෂිත ණය පාඩු සඳහා කරනු ලබන ප්‍රතිපාදන වලදී වඩාත් විනිවිදභාවයෙන් කළමනාකරණය කිරීම සඳහා දේශීය ආදායම් පනත යටතේ අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමටද යෝජනා කරනවා. එමෙන්ම දේශීය ආදායම් පනත යටතේ බදු පරිපාලන තීන්දු, අභියාචනයට යටත් වන කාල සීමාවක් තුළ ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි අවශ්‍ය නීති ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට යෝජනා කරනවා. බදු අභියාචනා කඩිනමින් විසඳීම සඳහා විශේෂ බදු අභියාචනා උසාවියක් ඇති කිරීමටද යෝජනා කරනවා.

ගරු කතානායකතුමනි,

පුද්ගල ආදායම් බද්ද ක්‍රියාත්මක වන්නේ වැටුප්, පොලී, කුලී, ලාභාංශ හෝ වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් මසකට රුපියල් 250,000කට වැඩි ආදායම් ලබන්නන් සඳහා පමණයි. උපයන විට බදු ගෙවීම්, පොලී මත රඳවා ගැනීම් බදු අහෝසි කර තිබෙනවා.
මසකට රුපියල් 250,000 වැඩි ආදායම් ප්‍රභවයන් ඇති වැටුප්, පොලී වැනි ආදායම් ලබන්නන්ට මාසිකව අදාළ බදු මුදල ගෙවීමට අවශ්‍ය නම් සිය සේවා ස්ථාන වලට හෝ බැංකුවලට ඒ පිළිබඳ උපදෙස් දීමට හා වසර අවසානයේ සමස්ථ ආදායම් ප්‍රකාශයක් මගින් සිය බදු වගකීම් තුලනය කරගැනීමට සරල ක්‍රමයක් හඳුන්වා දෙනු ලබනවා.

ඉදිරි වසර 5 තුළ කෘෂිකර්ම, සත්ව හා ධීවර කටයුතු වලින් ලැබෙන පෞද්ගලික හා ආදායම් බදු වලින් නිදහස් කර තිබෙනවා. තොරතුරු තාක්ෂණය හා ආශ්‍රිත දේශීය හා විදේශීය ඉපයීම් මෙන්ම, නේවාසිකව හෝ විදේශගතව උපයනු ලබන විදේශ ආදායම් ද ආදායම් බදු වලින් නිදහස් කර තිබෙනවා.

රජයේ බදු ආදායමෙන් සියයට 80ක් රැස් කරන්නේ ඉහළ ආදායම් හා මහා පරිමාණ ව්‍යාපාර, බැංකු හා මූල්‍ය ආයතන වලිනුයි. 2013/2014 වර්ෂවල මා විසින් හඳුන්වා දුන් Revenue Adminstration Management Information System සක්‍රීය කිරීමට අවශ්‍ය තාක්ෂණික හා නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීමට සැලසුම් කර තිබෙනවා. එකී බදු ගෙවන්නන් ඉලක්ක කරගෙන බදු කළමනාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති විවිධ අංශ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු වගකීම යටතේ පරිපාලනය කිරීම සඳහා එක් අංශයක් යටතට (Large Tax Payer Unit) පත් කිරීමට කටයුතු කර තිබෙනවා. බදු ගෙවන්නන්ගේ ස්වයං අනුකූලතාවය වර්ධනය කිරීම හා බදු විගණනය ශක්තිමත් කිරීමද බදු ආදායම වැඩි කර ගැනීමට අවශ්‍ය බැවින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට යෝජනා කරනවා. පෞද්ගලික අංශයේ බදු උපදේශකයන් හා විගණනකරුවන් බදු ගෙවන්නන් නියෝජනය කිරීමේදි සහ සහතික නිකුත් කිරීමේදී, වැරදි බදු වාර්තා සකස් කිරීම හෝ අනුබල දීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සලකා එවැනි බදු උපදේශක සේවා පවත්වා ගෙන යෑම අවලංගු කළ හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීමට යෝජනා කරනවා.

## ඉතිරි කිරීම් හා ආයෝජන

ජනතාවගේ ආදායම් මාර්ග උත්පාදනයට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට සමගාමීව සෑම දෙනාම ආවරණය වන ජාතික ඉතිරිකිරීම් වැඩපිලිවෙළක් ක්‍රියාත්මක කිරීමට අප පෙරමුණ ගන්නවා. සමෘද්ධිලාභීන්, ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා වාර්ෂිකව රුපියල් බිලියන.50කට අධික මුදලක් අයවැය මගින් සලසනු ලැබුවද, ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයන් හා සැදෑසමය සඳහා ප්‍රමාණවත් ආදායමක් ලැබෙන ඉතිරිකිරීම් ක්‍රමයක් සකස් වී නැහැ. එබැවින් සමෘද්ධි බැංකුව විසින් සෑම සමෘද්ධිලාභියෙකු සඳහාම සමෘද්ධි ජීවිත ඉතුරුකිරීම් (Samurdhi Life Savings Account) ගිණුම් විවෘත කිරීමටත්, සමෘද්ධි ජීවන ආධාර එම ගිණුම්වලට තැන්පත් කිරීමටත් යෝජනා කරනවා. එම ගිණුම්වල ස්ථාවර ඉතුරුකිරීම් ශේෂයන්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු මෙන්ම භාණ්ඩාගාර ඇපකර මගින් තහවුරු කර සමෘද්ධිලාභීන්ගේ ඉතුරුකිරීම් වැඩිකිරීමට පියවර ගන්නවා. එම ඉතුරුකිරීම් සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන සුරක්ෂිත කර ඇති අයුරින්ම සහතික කිරීම සඳහා

භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට ප්‍රතිපාදන සලසනවා. එම ආයෝජන සඳහා ලැබෙන පොලී ආදායම සියළු බදු වලින් නිදහස් කිරීමටද යෝජනා කරනවා. දැනට රාජ්‍ය බැංකුවල සමෘද්ධි බැංකුව විසින් තැන්පත් කර ඇති මුදල් වලින් සියයට 90ක ප්‍රමාණයක් සමෘද්ධිලාභීන්ගේ නේවාසික ආර්ථික හා ව්‍යාපාර දියුණු කිරීම සඳහා සියයට 7ක වාර්ෂික පොලියට ණය සැපයීමේ "නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමයක්" ක්‍රියාත්මක කරනවා.

සුභසාධන සමිති හා ආයතනවල පොලී ආදායම සඳහා පසුගිය රජය පැනවූ බදු එම ආයතනවල ඉතුරුකිරීම් දිරිගැන්වීම සඳහා  නිදහස් කිරීමට යෝජනා කරනවා.

පුද්ගල ඉතිරිකිරීම් දිරිගැන්වීම සඳහා වෛද්‍ය රක්ෂණ, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, නිවාස ණය, ලැයිස්තුගත සමාගම් කොටස්වල මසකට රු. 100,000 දක්වා කරනු ලබන පෞද්ගලික ආයෝජන ආදායම් බදු ගනනයේදී අඩු කළ හැකි ගෙවීම් ලෙස (qualifying paymets) සැලකීමට යෝජනා කරනවා.

ශ්‍රී ලංකාවේ නේවාසිකව සේවය කරන විදේශිකයන් ශ්‍රී ලංකාව තුළ උපයන විදේශ විනිමය හෝ විදේශවල ඇති සිය ඉපයීම් හෝ ශ්‍රී ලංකාවෙන් පිට බැංකු ණය වලින් සුපිරි මහල් නිවාස මිලදී ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීමට යෝජනා කරනවා.

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නියාමනය යටතේ දේපල ආයෝජන භාරය ( Sri Lanka Real Estate Investment Trust) මගින් නිත්‍ය නිවාස වෙළඳපළ ආයෝජන දිරිගැන්වීම සඳහා එම ආයතනවල ප්‍රාග්ධන ලාභ හා  ලාභාංශ ආදායම් බදු වලින් නිදහස් කිරීමට සහ මුද්දර බද්ද සියයට 0.75 දක්වා අඩු කිරීමට යෝජනා කරනවා.

දේශීය සමාගම් කොළඹ කොටස් වෙළඳපලේ ලැයිස්තු ගත කිරීම දිරි ගැන්වීම සඳහා 2021.12.31 දිනට පෙර ලැයිස්තු ගත කරනු ලබන සමාගම්වලට සියයට 50ක ආදායම් බදු සහනයක් ලබාදීමටත්, ඉන්පසු වසර 3ක් සඳහා අදාළ සමාගම් බද්ද සියයට 14ක් ලෙස පවත්වා ගැනීමටත් යෝජනා කරනවා.

ප්‍රාග්ධන ලැබීම් බද්ද සරලකර දේපල විකිණුම් මිල හෝ දේපලවල තක්සේරු කරුගේ වටිනාකම යන දෙකෙන් වැඩි වටිනාකම සඳහා බදු අයකිරීමට යෝජනා කරනවා. විදේශීය සමාගම්වල ලාභාංශ, සිය ව්‍යාපාර පුළුල් කිරීම, මුදල් හෝ කොටස් වෙළඳපලේ ආයෝජනය කිරීම හෝ ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කරන්නේ නම් ඔවුන්ගේ ලාභාංශ වලට අදාල බද්ද සඳහා වසර 3ක බදු විරාමයක් ලබාදීමට යෝජනා කරනවා.

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු විසින් ඩොලර් මිලියන 100ක අවමයකට යටත්ව ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගන්නා විට එම ආයෝජන සඳහා අවධානම් බර තැබූ ප්‍රතිපාදන (Risk weighted Provisioning) වෙන් කිරීමට අදාළ ශ්‍රී ලංකා මහ බැංකු රෙගුලාසි වසර 3ක කාලයක් සඳහා අත්හිටුවීමට හා එම ආයෝජනවල ප්‍රාග්ධන ලාභ හා පොලී, ආදායම් බදු වලින් නිදහස් කිරීමටද යෝජනා කරනවා.

අපනයන කර්මාන්ත, පශු සම්පත්හා කිරි ආශ්‍රිත නිෂ්පාදන (Dairy), රෙදිපිළි (Fabric), සංචාරක, කෘෂි නිපැයුම්, සැකසුම් කර්මාන්ත හා තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍ර සඳහා ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනසක් ඇති වන පරිදි සිදු කරන ඩොලර් මිලියන 10ට වැඩි ආයෝජන සඳහා උපායමාර්ගීක ආයෝජන නීති (Strategic Investment Law) යටතේ වසර 10ක උපරිමයකට යටත්ව බදු සහන සලසනවා.

කොළඹ හා හම්බන්තොට වරායන් කේන්ද්‍රකොට ගෙන ජාත්‍යන්තර වෙළඳාමේ භාණ්ඩ තොග හුවමාරු මධ්‍යස්ථාන (Commodity Trading Hub) වශයෙන් බන්ධිත ගුදම් (Bonded Warehouse) පහසුකම් සඳහා ආයෝජන දිරිගැන්වීමට එවැනි අක්වෙරළ (Offshore) ව්‍යාපාර ආශ්‍රිත ගුදම් පහසුකම් සඳහා කුලී බදු සහන දීමටද යෝජනා කරනවා.

## ජාතික ආරක්ෂාව

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවල රණවිරුවන්ගේ වෘත්තීමය කුසලතා වැඩිදියුණු කිරීම හා නවීන තාක්ෂණ පහසුකම් ලබාදීම සඳහා මැදිකාලීන

සැලැස්මක් සකස්කර තිබෙනවා. අප රටේ පවත්නා සම්පත් සීමාවන් මෙන්ම ප්‍රමුඛතා හඳුනාගැනීම තුළ ශ්‍රී ලංකා නාවික හමුදාව ශක්තිමත් කිරීමට මුල්තැන දී තිබෙනවා. මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම හා අපේ රට ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ගණුදෙණුකරුවන්ගේ තිප්පොලක් වීමේ තර්ජනය මුලිනුපුටා දැමීය යුතුයි. භාණ්ඩ smuggle කිරීම පාලනය කිරීම, ධීවර සම්පත් හා ධීවර ප්‍රජාවට අවශ්‍ය ආරක්ෂණ පහසුකම් ලබාදීමටත්, ඉන්දියානු සාගරයේ නාවික පහසුකම් සඳහා සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම සඳහාත්, එම ආයෝජනය දායක කර ගැනීමට රජය අපේක්ෂා කරනවා. එමෙන්ම ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාව ආපදා කළමනාකරණය ඇතුළු බහුවිධ කාර්යයන්හිදි සිදුකරනු ලබන කාර්යභාරයන් සඳහා අවශ්‍ය කෙටිකාලීන යන්ත්‍රෝපකරණ හා යටිතල පහසුකම් ගැනද අවදානය යොමු කර තිබෙනවා. එම මැදිකාලීන හා දිගුකාලීන සැලසුම් රාමුව තුළ අවශ්‍ය මූලික අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 20,000ක අතිරේක ප්‍රතිපාදන ත්‍රිවිධ හමුදාවට වෙන් කිරීමට යෝජනා කරනවා.

ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකා සේවාවල විශ්‍රාමික, අබාධිත රණවිරුවන්, මියගිය රණවිරුවන් හා එම පවුල්වල යැපෙන්නන් සඳහා රණවිරු සේවා අධිකාරිය දියත් කර ඇති අබාධිත රණවිරුවන්ට සහයක උපකරන ලබාදීම, නිවාස ණය, අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් හා ව්‍යවසාය සංවර්ධන හා වෛද්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කිරීමද යෝජනා කරනවා.

## මහජන ආරක්ෂාව

මහජන ආරක්ෂාව තහවුරු වන පරිදි පොලිස් සේවය ශක්තිමත් කිරීමට රජය විශේෂ අවධානයක් යොමුකර තිබෙනවා. සියළු පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට අවශ්‍ය පරිසරය තහවුරු කළ යුතුයි. මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, රථවාහන හා මාර්ග නීති ක්‍රමවත් ලෙස නියාමනය කිරීම, සංචාරක පොලිස් සේවා තර කිරීම මෙන්ම මංකොල්ලකෑම්, අපරාධ වැලැක්වීම සඳහා විශේෂ පුහුණු කිරීම් හා අවශ්‍ය පහසුකම් ලබාදීමටත් සැලසුම් කර තිබෙනවා. එමෙන්ම පොලිස් මුර සංචාරක කටයුතු පුළුල් කරමින් ප්‍රජා ආරක්ෂාව සඳහා විශේෂ පොලිස් රථ යෙදීමටද යෝජනා කරනවා. මහජන ආරක්ෂාවට හඳුනාගත් විවිධ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2,500ක අතිරේක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරනවා.

## තාක්ෂණික යටිතල පහසුකම්

රාජ්‍ය යාන්ත්‍රණය, හා වෙළඳපළ ක්ෂේත්‍රයන්හි ක්‍රියාවලිය සරල කරමින් කාර්යක්ෂම හා ජනතා කේන්ද්‍රීය සේවා සැපයීම හා දැනුම් හුවමාරුවේ මෙවලමක් ලෙස තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් ඩිජිටල් ආණ්ඩුකරණය පුළුල් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. දේශාන්තර විද්‍යුත් වාණිජ්‍යය සහ ජාත්‍යන්තර විද්‍යුත් ගෙවීම් ක්‍රම ස්ථාපනය කිරීම හා රට පුරා විහිදුනු අධිවේගී දත්ත හුවමාරු පද්ධතියක් හා ආශ්‍රිත ජංගම ජාල පද්ධතිය ස්ථාපනය කිරීම ඉන් ප්‍රධාන ආයෝජන මාර්ගයක් වෙනවා. දත්ත ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, බුද්ධිමය දේපල අයිතිය සඳහා නව නීති හා ආයතනික ව්‍යුහය සකස් කිරීමට මුල්තැන දෙනු ලබනවා.

තාක්ෂණ ක්ෂේත්‍රයේ අපනයන දායකත්වය හා ජාතික ආර්ථිකයේ දැණුම හා වෘත්තීය සේවා දායකත්වය පුළුල් වන අයුරින් ව්‍යවසාය සංවර්ධනයට දායක වීම මෙන්ම, තාක්ෂණික යටිතල පහසුකම් හා ආශ්‍රිත සේවාවන් පුළුල් කිරීම මගින් තාක්ෂණික ව්‍යවසාය ආර්ථිකයක් සඳහා පරිවර්තනය කිරීම මෙහි අපේක්ෂිත අරමුණයි. එබැවින් තාක්ෂණ ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 8,000ක විශේෂ ප්‍රතිපාදනයක් වෙන් කිරීමටද යෝජනා කරනවා.

## ගමට සන්නිවේදනය (Connect Sri Lanka)

තාක්ෂණය තුළින් සියළු පාර්ශව සම්බන්ධ කරගත් ඩිජිටල් ශ්‍රී ලංකාවක් “Technology-based society and digitally inclusive Sri Lanka” ඇති කිරීම රජයේ දැක්මයි. සියයට සියයක් 4G/ fiber Broadband ආවරණයක් ලබාදීමේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කළ “ගමට සන්නිවේදනය” වැඩසටහන සමස්ත රටම ආවරණය කෙරෙන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ටෙලිකොම් සංවර්ධන අරමුදල රුපියල් මිලියන15ක ආයෝජනයක් 2021 – 2022 කාලය තුළ සිදු කිරීමට සැලසුම් කර තිබෙනවා.

මෙම වැඩසටහන මගින් Mobile හා fixed broadband services සඳහා පුළුල් ආවරණයක් ලබාදෙනවා. දිවයින පුරා විසිර ඇති සියළුම ග්‍රාම නිළධාරි කොට්ඨාශ ආවරණය වන පරිදි broadband සබඳතා ලබාදීම සඳහා දුරකථන සැපයුම්කරුවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සමඟ සන්නිවේදන කුළුණු සහ fiber installations ලබාදීමට සැලසුම් කර තිබෙනවා.

මෙම සන්නිවේදන කුළුණු, අවශ්‍ය උපාංග හා තාක්ෂණික සේවා සඳහා දේශීය නිෂ්පාදන හා ශ්‍රමය යොදා ගැනීමට ප්‍රමුඛත්වය දී තිබෙනවා. එම සන්නිවේදන ජාලය පරිසර බලපෑම් අවම වන පරිදි සකස් කරනු ඇත. මෙම වැඩසටහන යටතේ සන්නිවේදන කුළුණු ඉදිකිරීම සඳහා හඳුනාගත් රජයේ ඉඩම් විදුලි සංදේශන නියාමන කොමිෂමට පවරණු ලබනවා. එමෙන්ම පවත්නා සම්පත් උපරිම ලෙස යොදා ගැනීම සඳහා විදුලි සංදේශන නියාමන කොමිෂම හා ලංකා විදුලිබල මණ්ඩලය ඒකාබද්ධව කටයුතු කරනු ඇති. 01.01.2021 සිට වසර 5ක බදු සහන කාලයක් එම ඉදිකිරීම් සඳහා දේශීය කර්මාන්තකරුවන්ට ලබාදීමට යෝජනා කරනවා. දුරකථන සංවර්ධන ගාස්තු වලින් සියයට 50ක් මෙම ආයෝජනය සඳහා වෙන් කිරීමට මා යෝජනා කරනවා.

## තාක්ෂණ උද්‍යාණ (Techno Parks)

තාක්ෂණ ක්ෂේත්‍රයේ අපනයන හා විදේශ ආදායම් ඉපයිය හැකි දායකත්වය වැඩිකර ගැනීම හා ජාතික ආර්ථිකයේ දැනුම හා වෘත්තීය සේවා පුළුල්වන අයුරින් තාක්ෂණික ව්‍යවසාය ආර්ථිකයක් ඉදිරි වසර 2 තුළ ඇති කිරීමට යෝජනා කරනවා. තාක්ෂණ ව්‍යාපාර හා ව්‍යවසායකත්වය කේන්ද්‍ර කරගත් ආයෝජන හා ආශ්‍රිත සේවා කර්මාන්ත සඳහා කෙරෙන මෙම පරිවර්තනය තුළින් තරුණ තරුණියන්ට ඉහළ ආදායම් ඉපිදවිය හැකි රැකියා නිර්මාණය කිරීම අපේක්ෂා කරනවා. ඒ සඳහා පූර්ණ යටිතල පහසුකම් සහිත කඩිනම් ව්‍යාපාර ආරම්භ කළ හැකි (plug and play) තාක්ෂණ උද්‍යාණ 5ක් ගාල්ල, කුරුණෑගල, අනුරාධපුරය, මහනුවර හා මඩකලපුව දිස්ත්‍රික්කවල ඇති කිරීමට යෝජනා කරනවා. මෙම තාක්ෂණික උද්‍යාන අධිවේගී මාර්ග පද්ධතියට හා අනෙකුත් යටිතළ පහසුකම් වලට සම්බන්ධ වන අයුරින් පරිසර හිතකාමී නව නගර වශයෙන් දියුණු කිරීමට රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

මාතර දෙනියාය ප්‍රදේශයේ වරාය, නාවික, ගුවන්, තාක්ෂණ, ඉංජිනේරු විෂයන් කේන්ද්‍රකරගත් නවීන විශ්ව විද්‍යාලයක් 2023ට පෙර ආරම්භ කිරීමටද අතිගරු ජනාධිපතිතුමා මූලිකත්වය ගෙන තිබෙනවා.

## සෞඛ්‍ය සේවා ආයෝජනය (Investment in Public Health)

පොදු ජනතාවගේ සෞඛ්‍ය සඳහා කෙරෙන ආයෝජනය කවරදාටත් වඩා ප්‍රමුඛත්වයක් ගෙන තිබෙනවා. COVID වසංගත උවදුර මර්ධනය කරමින් ජන ජීවිත පවත්වාගෙන යාම නොවැලැක්විය හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානය (World Health organization) මෙන්ම බොහෝ රටවල් විසින් පුරෝකථනය කර තිබෙනවා.

මේ වන විට ලෝකයේ කොවිඩ් ආසාදිතයින් ලක්ෂ 500 හා මරණ සංඛ්‍යාව ලක්ෂ 10ක් ඉක්මවා තිබෙනවා. බොහෝ රටවල දෙවන තුන්වන අදියරටද එම වසංගතය පැමිණ තිබෙනවා. එමෙන්ම, මුල් අවස්ථාවට වඩා රෝගය ඉක්මනින් පැතිරයමේ අවධානම් ලක්ෂණද මතු වී තිබෙනවා.

මෙම යතාර්ථය තුළ, දිවයින පුරා විහිදී ඇති සෞඛ්‍ය සේවා ස්ථාන, මාතෘ හා ළමා සායන, ඩිස්පැන්සරි හා වැඩිහිටි සේවා මධ්‍යස්ථාන රසායනාගාර සේවා, පර්යේෂණ ආයතන හා රෝහල් මෙන්ම සේවා මධ්‍යස්ථාන ආශ්‍රිත කාර්යමණ්ඩල පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 18,000ක අතිරේක ප්‍රතිපාදන සැපයීමට යෝජනා කරනවා.

කොවිඩ් ඇතුළු වසංගත රෝග නිරෝධානයේදී, තාවකාලිකව අහිමි වන ජීවනෝපාය අවස්ථාවන්ට රැකවරණයක් වන පරිදි නව රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටද යෝජනා කරනවා.

සේවක සංඛ්‍යාව 50 ඉක්මවන ව්‍යාපාර හා කර්මාන්තශාලා ඉලක්ක කරගෙන, එවන් ව්‍යාපාරික ආයතනවල පිරිවැටුමෙන් සියයට 0.25ක රක්ෂණ දායක මුදලක් අය කිරීමටද යෝජනා කරනවා. සේවක සංඛ්‍යාව 5ක් ඉක්මවන සිල්ලර හා තොග වෙළඳසැල් මෙන්ම හෝටල් සඳහාද මෙම රක්ෂණ ක්‍රමය යොදා ගැනීමට අපේක්ෂා කරනවා. සියළුම රාජ්‍ය සේවා වෙනුවෙන් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට සමගාමීව කොවිඩ් රක්ෂණ යෝජනා ක්‍රමයක්ද රජයේ දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

## ඖෂධ නිෂ්පාදනය

අප රටේ නිදහස් සෞඛ්‍ය සේවය සඳහා ඖෂධ ආනයනයට පමණක් ඩොලර් මිලියන 550ක් පමණ මුදලක් වාර්ෂිකව වැය වෙනවා. අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම සඳහා බැංකු හා මූල්‍ය පහසුකම් භාණ්ඩාගාර ඇපකර මත ලබාදීමට යෝජනා කරනවා. එමෙන්ම, දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සඳහා නවීන ආයෝජන කලාපයක් උපායමාර්ගික ආයෝජන පනත යටතේ ආරම්භ කිරීමටද යෝජනා කරනවා.

## ළදරු හා ගැබිනි මව්වරුන්ගේ පෝෂණ සංවර්ධනය

අප රටේ ළදරුවන් හා ගැබිනි මව්වරුන්ට පරිපූරක පෝෂණ ආහාරයක් ලෙස ලබාදෙන ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීම සඳහා බඩඉරිඟු, සෝයා, මුං වැනි ධාන්‍ය වර්ග යොදාගනු ලැබුවත් එම ධාන්‍ය නිෂ්පාදනය ප්‍රමාණවත් ලෙස නොලැබීම නිසා ත්‍රිපෝෂ බෙදාහැරීම කෙරෙන්නේ අවශ්‍ය ළදරුවන් හා මව්වරුන්ගෙන් අඩකටත් අඩු ප්‍රමාණයකටයි. එබැවින් මෙම අමුද්‍රව්‍ය ගොවීන්ගෙන් මිලදී ගැනීම හා ගබඩාකර තබාගැනීමත්, ත්‍රිපෝෂ නිෂ්පාදනය වැඩිකිරීමටත් රුපියල් මිලියන 1,500ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනු ලබනවා. මාස් කන්නයේ ධාන්‍ය අස්වැන්න නෙළීමත් සමඟ ආරම්භ කිරීමට නියමිත මෙම වැඩපිළිවෙළත් සමඟ ළදරුවන් හා ගැබිනි මව්වරුන් සඳහා අඛණ්ඩව නියමිත ත්‍රිපෝෂ ආහාර නොකඩවා ලබාදීම මාර්තු මාසයේ සිට ආරම්භ කරනවා.

## දුරස්ථ අධ්‍යාපන

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර ලෙස ඉගෙනුම් ක්‍රමවේද විධිමත් ලෙස පාසැල් පද්ධතිය තුළ ස්ථාපිත කිරීම හා පාසැල්වලට අන්තර්ජාල පහසුකම් ලබාදීම පුළුල් කිරීම අවශ්‍ය වී තිබෙනවා. විෂයානුබද්ධ ඉගෙනුම් ලබාදීම සඳහා e-තක්සලාව ඉගෙනුම් පද්ධතිය යාවත්කාලීන කිරීම හා පළාත් තොරතුරු තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමද එයට සමගාමීව ක්‍රියාත්මක විය යුතුයි. ග්‍රාමීය හා බොහෝ ජාතික නොවන පාසල්වල පවතින ගුරුවරුන්ගේ හිඟය හේතුවෙන් දරුවන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා අවම කිරීමට සහ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ පාසැල් අධ්‍යාපනය අඛණ්ඩව ලබාදීම සඳහා දුෂ්කර පාසැල්වලට රූපවාහිනී යන්ත්‍ර මගින් ගුරු ගෙදර අධ්‍යාපන නාලිකාව සියළු සිසුන්

සඳහා විවෘත කිරීම කඩිනම් කිරීමටද සැලසුම් කර තිබෙනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් විෂය නිර්දේශ නවීන අවශ්‍යතා අනුව පුළුල් කිරීම, ගුරු අධ්‍යාපන පුහුණු කටයුතු, විභාග ක්‍රමවේදයන් හා සියළු අධ්‍යාපන ආයතන ජාතික ප්‍රතිපත්තියක් තුළ නියාමනය කිරීමද සැලසුම් කර තිබෙනවා.

## වෘත්තීය අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා

විශ්ව විද්‍යාල අවස්ථා පුළුල් කිරීමට සමගාමීව තරුණ තරුණියන් අකර්ෂණය වන පරිදි හා තාක්ෂණ විද්‍යාල නවීකරණය “One TVET” සංකල්පය යටතේ විධිමත් නියාමනයක් තුළ උසස් තාක්ෂණවේදී උපාධි ආයතන වශයෙන් තාක්ෂණ සහ කාර්මික විශ්ව විද්‍යාල විද්‍යා ආයතන පද්ධතිය ශක්තිමත් කිරීමට රජය ප්‍රමුඛතාවය දී තිබෙනවා. එමෙන්ම වෘත්තීය අධ්‍යාපනය හා ව්‍යවසායකත්වය සම්බන්ධ කරමින් තොරතුරු තාක්ෂණය, ඉංග්‍රිසි හා අනෙකුත් භාෂා, කාර්මික හා තාක්ෂණික දැනුම සහිත සිසුන් බිහිකිරීමද මෙම වැඩපිළිවෙළේ මූලික අරමුණයි. දැනට රජයේ වෘත්තීය අධ්‍යාපන ආයතන සඳහා වර්ෂයකට බඳවා ගනු ලබන ලක්ෂයක (100,000) පමණ ශිෂ්‍ය සංඛ්‍යාව ලක්ෂ දෙක (200,000) දක්වා වැඩිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, තාක්ෂණික උපකරණ ලබාගැනීම, ගොඩනැගිලි නඩත්තු හා නවීකරණය කිරීම කඩිනමින් කළ යුතු වෙනවා. වෘත්තීය අධ්‍යාපන ආයතනවල ආචාර්යවරුන්ගේ හා ආයතන කාර්ය මණ්ඩලවල වෘත්තීමය කාර්යසාධනය පදනම් කරගෙන දෙනු ලබන දීමනා ලබාදීමටත්, වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය පදනම් කරගෙන මසකට රු.4,000ක ශිෂ්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටත්, රුපියල් මිලියන 3,000ක අමතර ප්‍රතිපාදනයක් ලබාදීමට යෝජනා කරනවා.

හෙද හා සාත්තු සේවා වෘත්තීය අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා හෙද විදුහල, උපාධි ප්‍රදානය කරන අධ්‍යාපන ආයතනයක් බවට උසස් කිරීමට යෝජනා කරනවා.

වෘත්තීය අධ්‍යාපනයට යොමුවන තරුණ තරුණියන්ට සිය වෘත්තීය නිපුණතා අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස නිමකිරීමෙන් පසු සිය නිපුණතා තුළින් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආරම්භක ව්‍යාපාර අරමුදලක් (Start up Capital) වශයෙන් රු. 500,000ක ණය

මුදලක් සියයට 4ක වාර්ෂික පොලියක් යටතේ ලබා දීමට යෝජනා කරනවා. එම ණය පොලී හා ණය වාරික ගෙවීමට වසරක සහන කාලයක් (grace period) දෙනු ලබන අතර ණය මුදල ගෙවා දැමීම සඳහා වසර 4ක කාලයක් ලබා දීමටද යෝජනා කරනවා. මේ අනුව, රු. 12,000ක පමණ අඩු පොලී සහිත වාරික ගෙවීමේ අවස්ථාව එම ව්‍යවසායකයින්ට හිමිවෙනවා. එම මුදල නිසි ලෙස අනුමත ව්‍යාපාරය සඳහා යොදවන බව සහතික කිරීම,

පසු විපරම්කිරීම හා ව්‍යාප්ත සේවා සැපයීම සඳහා සියයට 0.25ක commitment fee එකක් වාර්ෂිකව අයකිරීමට යෝජනා කරනවා. මෙම ව්‍යාපාර වසර 5ක කාලයක් සඳහා ආදායම් බදු වලින් නිදහස් කිරීමටද යෝජනා කරනවා. බැංකු හා මූල්‍ය ආයතන විසින් සපයනු ලබන එවැනි ආරම්භක ප්‍රාග්ධනය (Start up Capital) පොලී පිරිවැය (Cost of Funds) බදු ආදායම ගනනය කිරීමේදී අඩු කළ හැකි වියදම් ලෙස සැලකීමට යෝජනා කරනවා.

One TVET සංකල්පය යටතේ ප්‍රමිතිගත කෙරෙන පෞද්ගලික අංශයේ වෘත්තීය අධ්‍යාපන ආයතනවල දායකත්වය වර්ෂයකට සිසුන් 50,000 දක්වා වැඩිකිරීම දිරි ගැන්වීම සඳහා දැනට සිටින සිසුන් සංඛ්‍යාව දෙගුණ කරනු ලබන ආයතනවල ආදායම් සඳහා වසර 5ක බදු විරාමයක් ලබාදීමටද යෝජනා කරනවා. එමෙන්ම සංචාරක, සෞඛ්‍ය, ඉදිකිරීම්, කෘෂි හා සත්ව ගොවිපොල පාලන වැනි ක්ෂේත්‍රවල සුවිශේෂ වෘත්තීය කුසලතා සහිත තරුණ තරුණියන් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් විදේශ රැකියා සඳහා යොමු කිරීමටද යෝජනා කරනවා.

## විශ්ව විද්‍යාල පහසුකම් පුළුල් කිරීම

ජාතික විශ්ව විද්‍යාලවල වෛද්‍ය, ඉංජිනේරු, තාක්ෂණ, නීති, වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ ආදී විෂයන් සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එයට සමගාමීව, රැකියා අවස්ථා සිසු ලෙස ඉල්ලුම් කෙරෙන සුවිශේෂිත වූ විෂය ක්ෂේත්‍රයන් ඉලක්ක කරගෙන නේවාසික නොවන නගර විශ්ව විද්‍යාල (City Universities) දිස්ත්‍රික්කයකට එක බැගින් පිහිටුවීමට යෝජනා කරනවා. මෙහි ආරම්භයක් ලෙස කළුතර, අම්පාර, පුත්තලම, නුවරඑළිය දිස්ත්‍රික්කවල දැනට පවත්නා වෘත්තීය අධ්‍යාපන හෝ වෙනත් රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි හා යටිතල පහසුකම්

ඉදිකිරිමට යෝජනා කරනවා. මේ සඳහා විශේෂ ප්‍රතිපාදන රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට යොජනා කරනවා.

## ක්‍රීඩා

ග්‍රාමීය මෙන්ම ජාතික මට්ටමේ පාසැල් සිසුන් හා තරුණ තරුණියන්ගේ සහභාගීත්වය පුළුල් කිරීම මගින් සමාජ විරෝධි ක්‍රියාවන්ගෙන් ඔවුන් වලක්වාගෙන අධ්‍යාපන කටයුතු වලට අමතරව මූලික බාහිර ක්‍රියාකාරකම් ලෙස ක්‍රීඩා සංවර්ධනය ජාතික ආයෝජනයක් ලෙස රජය සලකනවා.

ක්‍රීඩා පාසැල් මෙන්ම සංස්කෘතික මධ්‍යස්ථාන හා බද්ධ වූ තරුණ ප්‍රජා මධ්‍යස්ථාන මගින් තරුණයන්ගේ ආකර්ශණය ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කිරීම සඳහා කෘතිම ධාවන පථ සහිත ක්‍රීඩා පාසැල් 10ක් දියුණු කරනවා. 2032 ඔලිම්පික් ක්‍රීඩා සඳහා ක්‍රීඩා සංකීර්ණයක් නිර්මාණය කිරීමත්, ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා සඳහා කාන්තා සහභාගීත්වය පුළුල් කිරීමත්, 2025 වන විට

ඩොලර් මිලියන 1,000ක ක්‍රීඩා ආර්ථිකයක් නිර්මාණය කිරීමේ 2021-2024 මැදිකාලීන ආයෝජනයේ ආරම්භක ප්‍රාග්ධනය ලෙස රුපියල් මිලියන 2,000ක අතිරේක ප්‍රතිපාදනයක් වෙන්කිරීමට යෝජනා කරනවා. කුරුණෑගල, යාපනය, ටොරින්ටන්, බෝගම්බර හා දියගම ක්‍රීඩාංගනවල කෘතිම ධාවනපථ ඉදිකිරීමත්, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා සඳහා තොරතුරු තාක්ෂණය හා නවීන තාක්ෂණික පහසුකම් සහිත නවීන ක්‍රීඩා නගරයක් සූරියවැව ප්‍රදේශයේ ඉදිකිරීමද මෙම වැඩපිළිවෙළට ඇතුලත් වෙනවා.

## නාගරික ඇවිදින මංතීරු හා පොදු පහසුකම් (walking tracks and connected common facilities)

දිවයින පුරා විසිර ඇති මහා නගර සභා සහ නගර සභා බල ප්‍රදේශවල නාගරික ඇවිදින මංතිරු හා ආශ්‍රිත ප්‍රජා පහසුකම් පරිසර හිතකාමී සහ ඒ ඒ ප්‍රදේශවල ජෛව විවිධත්වය මතු කරමින් ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. ප්‍රජා අවශ්‍යතා මෙන්ම සෞඛ්‍ය සම්පන්න බාහිර විවේකි පරිසරයක් නාගරික ජනතාවගේ මූලික අවශ්‍යතාවක් බැවින් එම පහසුකම් දියුණු කිරීමට රුපියල් මිලියන 2,000ක් වෙන් කිරීමටද යෝජනා කරනවා.

## සංචාරක කර්මාන්තය

පාස්කු ප්‍රහාරයෙන් කඩා වැටුණු සංචාරක ව්‍යාපාර යළි හිස එසවීමටත් පෙර කොවිඩ් ලෝක වසංගත තත්ත්වය තුළ පසුබෑමකට ලක් වී තිබෙනවා. ප්‍රසංශණීය ලෙස විවිධාංගීකරණය වී ඇති අපේ රටේ සංචාරක කර්මාන්තය හා සංචාරකයින්ගේ සිත්ගන්නා ස්ථාන මෙම අවස්ථාවේ ආරක්ෂා කරගනිමින් සාමාන්‍ය තත්ත්වය තුළ දියුණු කිරීමට අප ක්‍රමවේදයන් සකස්කළ යුතු වෙනවා. ඒ සඳහා කාලයක් ගත වුවත්, සංචාරක කර්මාන්තය ඩොලර් බිලියන 10 ඉක්මවන ක්ෂේත්‍රයක් ලෙස දියුනු කිරීමේ ඉඩ ප්‍රස්ථා බොහෝයි.

අපේ රට වැසියන් විදේශ සංචාර සඳහා වැයකළ ඩොලර් මිලියන 1,500කට ආසන්න විදේශ විනිමයත් දේශීය සංචාරක කටයුතුත් සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන යටතේ දියුනු කිරීම මගින් සංචාරක කර්මාන්තය කෙටි කාලයකින් තරමක් දුරට දියුණු කළ හැකියි. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ දෙනු ලැබූ ණය පහසුකම් යටතේ දෙනු ලබන සහන හා ණය අයකිරීම් 2021 සැප්තැම්බර් 30 දක්වා දිර්ඝ කිරීමට යෝජනා කරනවා. ඒ සඳහා සියයට 50ක භාණ්ඩාගාර ඇපකර අදාළ බැංකුවලට ලබාදීමටද යෝජනා කරනවා. සංචාරක ව්‍යාපාරික කටයුතුවල පලාත් පාලන ආයතන විසින් අයකරනබදු හා ගාස්තු සරල කර උපරිමයකට යටත් කිරීමට අවශ්‍ය සංශෝධන කිරීමටද යෝජනා කරනවා.

## පුරාවිද්‍යා හා සංස්කෘතික උරුමයන්

පුරාවිද්‍යා උරුමයන් හා සංස්කෘතිමය උරුමයන් විහිදීම් සංරක්ෂණය සඳහා අදාළ ආයතන හා ජනාධිපති කාර්යසාධන බලකාය ඒකාබද්ධ පුරාවිද්‍යා උරුම කළමනාකරණයට අවශ්‍ය ශක්තිමත් නීතිමය රාමුවක් සකස් කිරීමට ප්‍රමුඛත්වය දී තිබෙනවා. පුරාවිද්‍යා හා සංස්කෘතික මධ්‍යස්ථාන පුනුරුත්තාපන කටයුතු සඳහා අයවැය විසින් සලසා තිබෙන ප්‍රතිපාදන වලට අමතරව දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් වැඩිදියුනු කිරීම සඳහා රුපියල් මිලියන 50ක අතිරේක ප්‍රතිපාදන සලසනවා.

## විදේශ රැකියා

අප රටේ ලක්ෂ 15ක් පමණ විදේශ රැකියා වල නිරත වෙනවා. මේ අයගෙන් බහුතරයක් ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභි කාන්තාවන්. 2010 සිට 2014 කාලය තුළ පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශ රැකියාවලට යැවීමට අප කටයුතු කළේ ග්‍රාමීය ප්‍රදේවල අඩු ආදායම්ලාභී පවුල්වලට ඉහළ ආදායම් ලබා ගැනීමේ ක්‍රමවේදයක් වශයෙනුයි. ඒනිසා ඩොලර් බිලියන 4ක්ව පැවති ඔවුන්ගේ ඉපයීම් ඩොලර් බිලියන 7ක් දක්වා වැඩිකර ගැනීමට හැකිවුණා. 2015 සිට 2019 දක්වා විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් යැවීමට සාපේක්ෂිතව එම රැකියා වලින් ලබන ආදායම ඩොලර් බිලියන 6.5ට අඩු වුණා.

ගරු කතානායකතුමනි,

මෙම තත්ත්වය වෙනස් කර නිපුණතා වැඩි, පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා වලට යොමු කිරීමටත්, විදේශ රැකියා වෙළඳපළ විවිධාංගිකරණය කිරීමටත්, වෘත්තීය අධ්‍යාපන ආයතන, විදේශ රැකියා කාර්යාංශය හ විදේශ රැකියා ආයතන ඒකාබද්ධ වැඩසටහනකට යොමු කරනවා. විදේශ රැකියාවල නිරතවන්නන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීමට 2013දී මා කළ යෝජනාවද ක්‍රියාත්මක කරනවා. විදේශ රැකියාවල නිරතවන්නන් ශ්‍රී ලංකාවේ බැංකු වලට එවනු ලබන විදේශ විනිමය මුදල් සාමාන්‍ය විනිමය අනුපාතයට වඩා ඩොලරයකට රුපියල් 2 බැගින් ගෙවීමටද යෝජනා කරනවා.

කොවිඩ් වසංගතයට මුහුණ දී ශ්‍රී ලංකාවට පැමිණීමට බලාපොරොත්තු වු රටවල් 126 රැකියාවල නිරත වූ 45,000ක් මේ වන විට ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කර තිබෙනවා. රටේ පවත්නා සෞඛ්‍ය පහසුකම්වලට අනුකූලව පැමිණීමට අපේක්ෂිත පිරිස්වලට පහසුකම් සපයනවා.

## කෘෂිකර්මය

එළඹ ඇති 2020 - 2021 මාස් කන්නයට ස්වභාවධර්මය ආශිර්වාද කිරීමක් ලෙස දිවයින පුරා මෝසම් වැසි ලැබෙමින් පවතිනවා. මාස් කන්නය නමින් අපගේ කෘෂි සංස්කෘතිය හඳුන්වන්නේ සැම බිම් අගලක්ම වගා කරන ප්‍රධාන නිෂ්පාදන කාලසීමාවයි. “බත

බුලතින් සරු රටක්" ලෙස අපේ මුතුන් මිත්තන් මේ දිවයින හැඳින්වූයේ ආහාර සුරක්ෂිතතාවයටයි. ස්වභාව ධර්මය අපට කාරුණික වන විට, අප රටේ ආර්ථික වර්ධනය සමාන්‍යයෙන් සියයට 5 ඉක්මවනවා. මේ ආශිර්වාදය සහල්, බඩඉරිඟු, එළවළු, පළතුරු, මිල ඉහළ දැමීමට ඉඩ දෙන්නේ නැහැ. ඒ ගොවි නිපැයුම්වලට අමතරව විදුලිබලය, වාරිමාර්ග පද්ධතිය, පානීය ජල සැපයුම, වනජීවි හා වන සම්පත අපගේ ජාතික නිෂ්පාදනයට දායකවනවා. එම නිසා මෙය උද්ධමනය පාලනය කිරීමේ ආශිර්වාදයක්ද වෙනවා. අපට ලැබෙන සෑම ජල බිංදුවකටම අප වටිනාකමක් එකතු කළ යුත්තේ ඒ ස්වභාවික ආශිර්වාදය වෙනුවෙනුයි.

සහල්, බඩඉරිඟු, කුරහන්, තල, උඳු ආදී ධාන්‍ය වර්ග සඳහා සහතික මිල ක්‍රමය මගින් එම ගොවීන් දිරිමත් කිරීමට අප සහතික වෙනවා. එළවළු, පළතුරු, පොල් ඇතුළු වගා නිෂ්පාදනවලටත් මෙය ආශිර්වාදයක්. එබැවින් සෑම දිස්ත්‍රික්කයකටම, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පොහොර ලේකම් කාර්යාලය පොහොර සැපයුම සහතික කිරීමට වගබලා ගත යුතු වෙනවා. ඒ සඳහා වී පොහොර නොමිලේ ලබාදීමටත් අනෙකුත් වගාවන් සඳහා කිලෝ 50ක් රු.1,500ක සහන මිලකටත් ලබාදීම සහතික කරනවා. මෙයට සමගාමීව කාබනික පොහොර භාවිතය වැඩි කරමින් උසස් ගුණයෙන් යුත් මිශ්‍ර පොහොර භාවිතය දිරි ගන්වන කාබනික භෝග වගා කලාප සංවර්ධනය කරනවා.

වී වගා කළ හැකි කුඹුරු හා ගොඩ ඉඩම් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන තිබෙනවා. වගා කළ හැකි සෑම බිමක්ම කවර හෝ වගාවකට යොමු කිරීම ජාතික ප්‍රමුඛතාවක්. සියළුම කුඹුරු හා ඉඩම් හිමියන් එළඹ ඇති මාස් කන්නයේ කඩිනම් වගාවන් සඳහා යොමුවන ලෙස මා ඉල්ලා සිටිනවා.

වගා නොකරන පුරන්කුඹුරු, නොසලකා හැර ඇති කෘෂිකාර්මික ඉඩම් ඵලදායී කෘෂිකාර්මික කටයුතුවලට යොමු කිරීමට දිස්ත්‍රික් ලේකම්වරයාට බලය පැවරෙන පරිදි 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධණ පනත සංශෝධනය කිරීමට යෝජනා කරනවා.

කෘෂි නිෂ්පාදන අතිරික්තයක් ඇතිකර එම භාණ්ඩවල තොග පවත්වා ගැනීමට වී අලෙවි මණ්ඩලයට අමතරව දිස්ත්‍රික් ලේකම්වරුන්, සමූපකාර හා ගොවි සමිති ඒ සඳහා දිරිගන්වනවා. දේශීයව නිපදවිය හැකි සියළු කෘෂි නිෂ්පාදන ආනයනය සීමා කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය නොකඩවා පවත්වා ගැනීමටද යෝජනා කරනවා.

බී ළූනු, රතු ළූණු, අර්තාපල්, අමු හා වියලි මිරිස් නිෂ්පාදනය දිරිගැන්වීමට සහතික මිල ක්‍රමයට අමතරව බීජ, පොහොර ලබාදීම, ව්‍යාප්ත සේවාවන් පුළුල් කිරීමට අයවැය මගින් ප්‍රතිපාදන සකසා දී තිබෙනවා.

එළවළු හා පළතුරු කල්තබා ගතහැකි ශීතාගාර ලබාගැනීමට තීරුබදු පහසුකම් හා ණය පහසුකම් පුළුල් කිරීමටද අවශ්‍ය ප්‍රතිපාදන සගසා තිබෙනවා.

කහ, ඉඟුරු ආනයනය මුළුමනින්ම තහනම් කර ඇති අතර මෙම භෝග නිෂ්පාදන ඉහල නංවා ගැනීමට පොල් හා රබර් වතුවල අතිරේක භෝග වශයෙන් වගා කිරීමට වගා ආධාර ක්‍රමයක්ද යෝජනා කරනවා.

**දේශීය කිරි කර්මාන්තය**

කිරිපිටි ආනයනය සඳහා ඩොලර් මිලියන 300කට අධික වාර්ෂිකව වැයවන විදේශ විනිමය වියදම (රුපියල් බිලියන. 55ක් පමණ) අඩු කර ගැනීමත්, දියර කිරි සඳහා වැඩිවන ඉල්ලුම දේශීයව සපයා ගැනීම සඳහාත්, රජයේ ප්‍රතිපත්තිවල මුල්තැනක් දී තිබෙනවා. පිටරටට ගලා යන මෙම විශාල විදේශ විනිමය දේශීය කිරි ගොවින් හා නිෂ්පාදකයින්ට ලබාදීම තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුළුල් සංවර්ධනයක් මෙන්ම ග්‍රාමීය ගොවීන් අතර විකල්ප ආදායම් මාර්ග ඇති කිරීමටත් එය දායක වෙනවා.

විවිධ පරිමාණයෙන් ක්‍රියාත්මක වන කිරි ගොවිපොලවල්වල දෛනිකව එක් ගවයෙකුගෙන් ලබා ගන්නා කිරි ප්‍රමාණය ලීටර් 4.5ක සිට 22.4ක් ලෙස විශාල වෙනසක් වාර්තා වෙනවා. ආනයනය කළ කිරි ගවයින්ගේ ජීව හැකියාව අනුව ලීටර 20ට වඩා ඉහළ නිෂ්පාදනයක් කළ හැකි බව විශේෂඥයින් පෙන්වා දී තිබෙනවා. තණබිම් හා තණබිම් ලෙස වගා කළ හැකි ඉඩම්වල හිඟකමත්, උෂ්ණත්වය හා

ජලකළමනාකරණ ගැටළු මෙන්ම පෝෂණයෙන් යුත් සත්ව ආහාර හිඟකමත්, නවීන තාක්ෂණ ක්‍රමවේදයන් ගොවිපොළවල නොමැතිකමත්, ගවයින් ගැබ් නොගැනීම ආදී ගැටළුත්, කිරි නිෂ්පාදනයේ දියුණුවට ඇති සීමාවන් වී තිබෙනවා.

එබැවින්, ජාතික පශු සම්පත් මණ්ඩලයේ රිදීගම හා බෝපත්තලාව ගොවිපොළවල් ගව අභිජනන මධ්‍යස්ථාන ලෙස දියුණු කිරීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීම, එම ගවයින් සඳහා සත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය පෝෂ්‍ය තෘණ, බඩඉරිඟු, සෝගම් ආදී භෝගයන් සත්ව ගොවිපොළවල් තුළ වගා කිරීමටත් සැලසුම් කර තිබෙනවා.
සත්ව අභිජනන කටයුතු හා ව්‍යාප්ත සේවා පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ කිරි ගොවිපොළවල් සංවර්ධනය කිරීමට රජයේ දායකත්වය වැඩි කිරීමටද යෝජනා කරනවා. කුඩා හා මධ්‍යම පරිමාණ කිරි ගොවිපොළවලට අවශ්‍ය කිරි ගවයින් මිලදී ගැනීම, පරිසර හිතකාමී ගව මඩු සකස් කර ගැනීම හා උපකරණ මිලදී ගැනීමට සියයට 7.5ක වාර්ෂික පොලිය යටතේ රුපියල් ලක්ෂ 5ක් දක්වා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටද යෝජනා කරනවා.

දේශීය කිරි ගොවීන්ගෙන් දියර කිරි නවීන තාක්ෂණය යටතේ එක් රැස් කිරීම, කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි කිරීම හා දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා කරනු ලබන ප්‍රාග්ධන ආයෝජන අවුරුදු 2ක් තුළ ක්ෂය කිරීමට (Depriciation) යෝජනා කරනවා. කිරිපිටි ආනයනය වෙනුවට කිරිපිටි අපනයන සැකසුම් කිරීම සඳහා එම සමාගම් විසින් කරන ඩොලර් මිලියන 25ට වඩා වැඩි ආයෝජන සඳහා වසර 5ක කාලයකට උපායමාර්ගික ආයෝජන බදු යටතේ සහන ලබාදීමටද යෝජනා කරනවා.

## ධීවර ආර්ථිකය

ග්‍රාමීය ආදායම් මාර්ග හා පෝෂණ ආහාර සුලභ කිරීම සඳහා වසරකට පැටව් මිලියන 50ක් වැව් හා ජලාශවලට නිකුත් කරමින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො.250,000ක් දක්වා වැඩි කිරීමට රුපියල් මිලියන 150ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.

අපනයන වෙළඳපළේ ආකර්ශණීයම මත්ස්‍ය වර්ග හා පැළෑටි (Aquatic Plants) අපනයනය වැඩිකර ගැනීම සඳහා පවත්නා පරිපාලන ක්‍රමවේදයන් සරල කිරීම, tissue culture ක්‍රමයට පැළෑටි දියුණු කිරීම, මත්ස්‍ය ආහාර සුලභ කිරීම සහ ගුවන්තොටුපොළ පහසුකම් හා ගුවන් පහසුකම් වැඩි කිරීමට යෝජනා කරනවා. ඉස්සන්, කකුළුවන්, කාප්, තිලාපියා, මොදා වැනි මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මඩකලපුව, යාපනය, පුත්තලම, මන්නාරම දිස්ත්‍රික්කවල තෝරා ගත් ස්ථානවල පරිසර ප්‍රමිතීන්ට අනුකූලවූ යටිතල පහසුකම් ඇතුලත් මත්ස්‍ය ගොවිපොල කලාප සංවර්ධනය සඳහා රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කරනවා.

කරවල, උම්බලකඩ හා ටින්මාළු නිෂ්පාදනය සඳහා ලංකාව තුළ නොමැති මත්ස්‍ය වර්ග ආනයනය කිරීමේ ක්‍රමවේදය සරල කරමින් දේශීය නිෂ්පාදන පුළුල් කිරීම සඳහා ආනයනයේදී අයකරනු ලබන බද්ද ඉහළ මට්ටමක පවත්වා ගනු ලබනවා. පාරිභෝගිකයින්ට හා ධීවර ප්‍රජාවට හිතකර පරිදි ධීවර සංස්ථාව ලාභදායී ව්‍යාපාරයක් ලෙස පූර්ණ ප්‍රතිසංවිධානයකට ලක් කිරීම සඳහා රුපියල් මිලියන.500ක අතිරේක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරනවා.

යුරෝපා ප්‍රමිතියට කුඩාවැල්ල, බේරුවල, දෙවිනුවර හා ගාල්ල හරිත ධීවර වරාය පහසුකම් ඇතිකිරීම, පේදුරුතුඩුව, ඔලුවිල්, ගන්දර ධීවර වරාය සංවර්ධනය, කප්පරතොට, දොඩන්දූව, හික්කඩුව වරාය හා නැංගුරම් පොළවල් සංවර්ධනය, නවීන බෝට්ටු හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට දැනට සලසා ඇති ප්‍රතිපාදන 2021-2023 මැදි කාලය තුළ තවදුරටත් වැඩි කිරීමටද යෝජනා කරනවා.

## වැවිලි කර්මාන්තය

තේ වගාව සඳහා නව තාක්ෂණික ක්‍රම හා කාළගුණික බලපෑම් අවම කිරීමත්, කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම කෙරෙහිත් අප විශේෂ අවධානය යොමු කර තිබෙනවා. කුඩා රබර් වතු වල ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම හා ස්වභාවික රබර් ආශ්‍රිත කර්මාන්ත මගින් එම ක්ෂේත්‍රයේ ලාභදායිත්වය වැඩිකර ගත හැකි වෙනවා. පොල් ඉඩම්වල ඵලදායීතාවය වැඩි කිරීම සඳහා එම ඉඩම්වල අගල් හා ජල සංරක්ෂණ ක්‍රමවේදයන්, බිංදු ජලසම්පාදන ක්‍රමවේදයන් මෙන්ම පොහොර යෙදා ගැනීමටත්, පුරන්

කුඹුරුවල පොල් හා තැඹිලි වගාවට යොදා ගැනීමත් ප්‍රමුඛතා ලෙස හඳුනාගෙන තිබෙනවා.  දේශීය කිතුල් හා තල් කර්මාන්ත විවිධාංගිකරණය කිරීම මගින් එම නිෂ්පාදන අපනයන වෙළඳපළ කරා දියුණු කිරීමට සැලසුම් කර තිබෙනවා.

කන්තලේ, බදුල්ල, මොනරාගල ප්‍රදේශවල උක් වගාකරුවන්ට ඉහළ ආදායමක් ලබාදිය හැකි පරිදි උක්වගාව වැඩිදියුනු කිරීමට  සැලසුම් කර තිබෙනවා. ලංකා සීනි සමාගමේ නිෂ්පාදන ධාරිතාව මෙ.ටො. 70,000කින් ඉහළ නැංවීමටද, සීනි  නිෂ්පාදන කර්මාන්තශාලා නවීකරණයටද, එතනෝල් හා ආශ්‍රිත නිෂ්පාදන වැඩි කිරීම සඳහා ස්කාගාර නවීකරණය කිරීමටද සැලසුම් කර තිබෙනවා.
ලංකා සත්‍ය කුරුඳු (Ceylon True Cinnamon) අපනයන වගා හා සැකසුම් කලාප පිහිටුවීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති වැඩසටහන් පුළුල් කිරීම සඳහාද ප්‍රතිපාදන සලසා තිබෙනවා.

තේ, පොල්, රබර්, කුරුඳු ප්‍රධාන වැවිලි ආර්ථිකය පුනර්ජීවණය කිරීමත් වැවිලි ක්ෂේත්‍රයේ විවිධාංගිකරණ කරන වැඩපිළිවෙළට ඇතුලත් කර තිබෙනවා.
ප්‍රාදේශීය ගොවීන්ද සම්බන්ධ කර ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ අක්කර 6,500ක කජු වගාකිරීමටත්, එම වගාවන්ගේ මුල් අවධියේ උඳු, මුං, මිරිස් ආදී භෝග වගා කිරීමටත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබෙනවා. මන්නාරම හා පුත්තලම දිස්ත්‍රික්කයේ කුඩා ඉඩම් හිමියන් කජු වගාවට සම්බන්ධ කරගැනීමට ශ්‍රී ලංකා කජු සංස්ථාව අවශ්‍ය පැලෑටි හා ව්‍යාප්ත සේවා සපයනු ලබනවා.

ගම්මිරිස්, කරාබුනැටි, එනසාල්, කෝපි ආදී වැවිලි භෝගවල දේශිය වටිනාකම වැඩිවන කාර්මික අපනයන කටයුතු සඳහා ආයෝජනය කරන ව්‍යාපාරිකයන්ට අවශ්‍ය ඉඩම් හා නවීන තාක්ෂණික උපකරණ ආනයනය සඳහා තීරුබදු සහන හා මූල්‍ය පහසුකම් ලබාදීමටත් යෝජනා කරනවා. වැවිලි ක්ෂේත්‍රයේ මෙම සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 2,000ක අතිරේක ප්‍රතිපාදන සැලසීමට යෝජනා කරනවා.

## මහා පරිමාණ වැවිලි සමාගම් ප්‍රතිසංස්කරණය

1992 වැවිලි සමාගම් පෞද්ගලීකරණය කළ තැන් සිට වසර 30කට ආසන්න කාලයක් විශාල පරිමාණයේ වතු කළමනාකරණය පෞද්ගලික අංශයට පැවරී තිබෙනවා. සමස්ත තේ නිෂ්පාදනය වැඩි වී තිබෙන්නේ කුඩා තේ වතු නිෂ්පාදනවලින් වන අතර මහ පරිමාණ වතුවල දායකත්වය සියයට 25කට පමණ අඩු වී තිබෙනවා. එම වතු බොහෝමයක් වගා විවිධාංගීකරණය වී නැහැ. ඉහළ වටිනාකමක් ඇති ශ්‍රී ලංකා සන්නාම ඇතුළුව තේ අපනයන කර්මාන්තයක් වශයෙන් දියුණු කර ඇත්තේද සමාගම් කිහිපයක් පමණි. බොහෝ සමාගම් වතුවල වගා නොකරන ඉඩම්ද දැකිය හැකියි. රෝහල්, පාසැල්, නිවාස, මාර්ග, විදුලිය, ජලය ආදී මූලික පහසුකම් සපයන්නේද රජය විසිනුයි.

රජයට ගෙවීමට ඇති බදු කුලී නොගෙවා ඇති සමාගම්ද මේ අතර තිබෙනවා. එසේම, සමාගම් වතු වල කම්කරුවන් සඳහා ලැබෙන්නේද ඉතා අඩු දෛනික වැටුපක්.

මේ තත්ත්වය යටතේ වඩා සාර්ථක ලෙස ක්‍රියාත්මක වී ඇති වතු සමාගම් දිරිගැන්වීමටත්, සෑහීමකට පත්විය නොහැකි වතු සමාගම්වල පෞද්ගලීකරණ ගිවිසුම් නැවත සමාලෝචනය කර වාණිජමය වශයෙන් දියුණු කළ හැකි විකල්ප ආයෝජන වැඩිදියුනු කර ගැනීමටත් පියවර ගැනීමට සිදුවෙනවා. එමෙන්ම, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප 2021 ජනවාරි සිට රුපියල් 1,000 දක්වා වැඩි කිරීමටද යෝජනා කරනවා. මෙම වැටුප ගෙවීමට නොහැකි වතු සමාගම්වල කළමනාකාරීත්ව ගිවිසුම් වෙනස් කර සාර්ථක ව්‍යාපාර සැලසුම් සහිත සමාගම් සඳහා ඉඩ ප්‍රස්ථා සැලසෙන නීති රාමුවක් ජනවාරි මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මා අදහස් කරනවා.

## මහා මාර්ග

අධිවේගී මාර්ග පද්ධතිය පුළුල් කිරීම යටතේ 2024 වන විට මධ්‍යම අධිවේගී මාර්ගය කෙරවලපිටිය හා මීරිගම කොටස මෙන්ම, කුරුණෑගල හා දඹුල්ල කොටසත්, පොතුහැර හා මහනුවර කොටසත්, නිමකිරීමට සැලසුම් කර තිබෙනවා. රුවන්පුර අධිවේගී මාර්ගයේ ප්‍රථම අදියර ලෙස ඉංගිරිය කහතුඩුව කොටස නිම කර ජාතික අධිවේගී මාර්ග පද්ධතියට සම්බන්ධ කෙරෙනවා. වරාය පිවිසුම් මාර්ගය මෙන්ම කැළණි පාලම සිට අතුරුගිරිය මාර්ගයද කඩිනමින් ඉදිකිරීමටත් ප්‍රසම්පාදන කටයුතු

අවසන් අදියරට පත්වී තිබෙනවා. ජාතික අධිවේගී මාර්ග පද්ධතිය හා එය ආශ්‍රිත වත්කම් වෙනම රාජ්‍ය ආයතනයක් යටතේ පවත්වා ගනිමින් අධිවේග මාර්ග නඩත්තුව හා සංවර්ධන කටයුතු කිරීමට සැලසුම් කර තිබෙනවා.

මෙරීන් ඩ්‍රයිව් මාර්ගය මොරටුව දක්වා දීර්ඝ කිරීමටත් පියවර ගෙන තිබෙනවා. කොළඹ හා තදාසන්න මාර්ග බාධා ඉවත් කර අතුරු මාර්ග හා පාලම් සංවර්ධනයට අවශ්‍ය රාජ්‍ය ආයෝජන ප්‍රතිපාදනද වෙන් කර තිබෙනවා. අයවැය ඇස්තමේන්තුවලින් හඳුනාගෙන ඇති, දිස්ත්‍රික් 25ම අවරණය වන 3 අවුරුදු මාර්ග සංවර්ධන වැඩසටහනට අදාළ මාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීමටද යෝජනා කරනවා.
අධිවේගී මාර්ග පද්ධතියට සමගාමීව හා එයට අනුපූරක මාර්ග පද්ධතියක් ලෙස කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල දුම්රිය මාර්ග පද්ධතිය පුළුල් කිරීමටත්, කැළණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල දක්වා වැඩි දියුණු කිරීමටත් යෝජනා කරනවා. දුම්රිය මාර්ග සංවර්ධනයේදී දුම්රිය දෙපාර්තමේන්තුව හා දේශීය ඉංජිනේරුවන්ගේ සෘජු දායකත්වය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

## විදුලිබලය

පසුගිය වසර 5ක කාලය තුළ එකදු විදුලි බලාගාරයක් විදුලි ජනන පද්ධතියට එකතු නොකිරීම තුළ 2021/2022 අඛණ්ඩ විදුලි සැපයීමේ අවධානම් මතු වී තිබෙනවා. එම අර්බුදකාරී තත්ත්වය වලක්වා ගැනීම සඳහා ලක්විජය විදුලි බලාගාරයට අතිරේක මෙගා වොට් 300ක ගල් අඟුරු බලාගාරයක් හා මෙගා වොට් 600ක ස්වභාවික වායු විදුලි බලාගාර 2ක් කඩිනමින් ඉදිකිරීමටද සැලසුම් කර තිබෙනවා. කෙරවලපිටිය විදුලි බලාගාර ස්වභාවික විදුලි බලාගාර බවට පරිවර්තනය කිරීම මෙන්ම පෞද්ගලික ස්වභාවික විදුලි බලාගාර යෝජනා මගින් අතිරේක ස්වභාවික විදුලි බලාගාර ඉදිකිරිමටද සැලසුම් කර තිබෙනවා. දැනට ඇති ඩීසල් විදුලි බලාගාර අවුරුදු 20ක් ඉක්මවා ඇති බැවින් ඒවා සඳහා ගෙවනු ලබන රුපියල් බිලියන 15ක අධික වියදම් අඩු කිරීමට අදාළ ගිවිසුම් සංශෝධනය කිරිමටද යෝජනා කරනවා. මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත හා විදුලිබල මණ්ඩල පනත කඩිනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඉවහල් වන පරිදි සංශෝධනය කිරීමටද යෝජනා කරනවා. 2023 වනවිට විදුලිය සඳහා ව්‍යාපාරිකයන් හා විදුලි පාරිභෝගිකයන් දරණ අධික පිරිවැය අඩුකර කලාපයේ

තරඟකාරී විදුලි සැපයුමක් ඇති කරමින් ව්‍යාපාර ආර්ථිකය දියුණු කිරීම අපගේ ඉලක්කයයි.

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

2030 වන විට මෙරට බලශක්තියෙන් අවම වශයෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලබා ගැනීම “සෞභාග්‍යයේ දැක්ම” හි ඉලක්කයක් වී තිබෙනවා. විදුලිබල ජනනය සඳහා ආනයනය කරනු ලබන ඉන්ධන සඳහා වාර්ෂිකව වැය කරන විදේශ විනිමය ඉතිරිවීම නිසා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය ප්‍රධාන ආනයන ආදේශ කර්මාන්තයක්ද වෙනවා.
දැනටමත් මෙගා වොට් 300ක සූර්යබලය විදුලි පද්ධතියට එක්කර ඇති අතර 2021 – 2023 කාලය තුළ දේශීය ආයෝජන හරහා මෙගා වොට් 1,000ක ධාරිතාවයක් එක් කිරීම අපේක්ෂා කරනවා.

රජයේ දායක මුදල් වලට පරිපූරකව ආසියානු සංවර්ධන බැංකුව හා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අඩු ආදායම්ලාභී නිවසකට කිලෝ වොට් 5 බැගින් නිවාස ලක්ෂයකට (100,000) සූර්ය ජනන පද්ධති ලබාදීම තුළින් මෙගා වොට් 500ක පමණ ධාරිතාවක් ඇති කිරීමට යෝජනා කරනවා. මේ සඳහා සියයට 4ක පොලී යටතේ ණය මුදල් සැපයීමටද යෝජනා කරනවා. එමගින් ඔවුන්ගේ විදුලි බිල්පත් වියදම් ඉතිරි වන අතර නිවසේ සිටම විදුලිය ජාතික පද්ධතියට ලබා දීමෙන් අතිරේක ආදායමක් ලබා ගැනීමටද හැකි වෙනවා. ආගමික ස්ථාන, රාජ්‍ය ආයතන, රෝහල්, පාසැල් හා ආරක්ෂක සේවා මධ්‍යස්ථානවල පියසි මත සූර්ය විදුලි ජනනය සඳහා ආයෝජනය කිරීමටද යෝජනා කරනවා. “ගමට බලාගාරයක් - ගමට ව්‍යවසායකයෙක්” තේමාව යටතේ ග්‍රාමීය මට්ටමින් තෝරාගත් ව්‍යවසායකයින්ගේ ආයෝජන මගින් විදුලිය බෙදාහැරීමේ පද්ධතියට අයත් ට්‍රාන්ස්ෆෝමර් 10,000කට සූර්ය ජනන බලාගාරවලට සම්බන්ධ කිරීමට යෝජනා කරනවා.

තාක්ෂණය හා උපකරණ පමණක් ආනයනය කර වගා ලිඳක් සහිත සුළු හා මධ්‍යම පරිමාණයේ වාණිජමය කෘෂි ගොවිපොළවල් සඳහා බිංදු ජල සම්පාදනය ඇතුළු නව තාක්ෂණ ක්‍රමයන් යොදා නිෂ්පාදනය වැඩි කිරීම සඳහා එවැනි ව්‍යවසායකයින් 10,000ක් සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප සඳහා රු.150,000 බැගින් ප්‍රාග්ධන ණය ආධාර ලබාදීමට යෝජනා කරනවා. උස්සාන වාරිමාර්ග හා Ro Plant පානීය ජල ව්‍යාපෘති සඳහා සූර්ය බලය ලබාදීමෙන් එම ව්‍යාපෘතිවල විදුලි වියදම අඩු කිරීමටද යෝජනා කරනවා. දැනට විදුලිය නොමැති ගම්වලට සූර්යබලාගාර හෝ ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම මගින් විදුලිය ලබාදී 2021 අවසන් වන විට සැමට විදුලි ඉලක්කය ඉටු කිරීමටද රුපියල් මිලියන 750ක් වෙන් කිරීමටද යෝජනා කරනවා.

ආයෝජන මණ්ඩලයේ දිරි ගැන්වීම් මගින් මෙගා වොට් 100ට වැඩි off shore සුළං හා පාවෙන සූර්ය බලාගාර සඳහා පෞද්ගලික ආයෝජන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගා වොට් 1,000 දක්වා වැඩි කිරීමටද යෝජනා කරනවා. සියළුම පුනර්ජනනීය බලශක්ති ආයෝජන සඳහා වසර 7ක බදු විරාමයක්ද ලබාදීමට යෝජනා කරනවා.

## වාරිමාර්ග

උමා ඔය බහුවිධ වාරිමාර්ග යෝජනා ක්‍රමය ආශ්‍රිත ජලාශ හා ජලවිදුලි බලාගාර කඩිනමින් නිම කිරීමටත්, මොරගහකන්ද කළු ගඟ ආශ්‍රිත වාරිමාර්ග පද්ධතිය පුළුල්කර, හුරුළුවැව යෝජනා ක්‍රමය ඇතුළු උතුරුමැද හා වයඹ පළාත්වල වාරි පහසුකම් වැඩිදියුණු කිරීමටත්, ගිං, නිලවලා හා මල්වතු ඔය ඇතුළු ප්‍රධාන ජල යෝජනා ක්‍රම කඩිනමින් නිම කිරීමටත්, 2021-2023 මැදිකාලීන අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

මාස් කන්නයේ අස්වැන්න නෙලා ගැනීමත් සමඟ දිස්ත්‍රික් 11ක කුඩා හා මධ්‍යම පරිමානයේ වැව් ප්‍රතිසංස්කරණ මගින් කෘෂිකාර්මික ප්‍රදේශවල ජල සංචිතය වැඩි කිරීමටත් 2021 යල් කන්නය සඳහා ගොවීන් සූදානම් කිරීමත් කඩිනම් කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.

## සැමට ජලය ජාතික සැලැස්ම 2021-2024

මේ රටේ සියළු දෙනාට පිරිසිදු පානීය ජලය සැපයීම රජයේ ප්‍රමුඛ වගකීමක් ලෙස සලකනවා. දැනට නල මාර්ගයෙන් පානීය ජලය ලබාදෙනු ලබන්නේ ජනගහනයෙන් සියයට 54ක පමණකටය. එම නිසා 2021-2024 කාලය තුළ සමස්ත රටේම පානීය ජලය ලබාදීම ඉලක්ක කරගෙන ප්‍රජා ජල ව්‍යාපෘති දහසක් නිෂ්පාදන ධාරිතාව උපරිම කිරීමේ ප්‍රධාන ව්‍යාපෘති 171ක මෙන්ම, නව ජල යෝජනා ක්‍රම හා කඩිනම් කර ඇති ව්‍යාපෘති සඳහා රුපියල් ට්‍රිලියනයක (රුපියල් බිලියන. 1,000ක්) ආයෝජනය සැලසුම් කර තිබෙනවා.

දේශීය ඉංජිනේරුවන්, සියළුම ජාතික මට්ටමේ මෙන්ම පහලම ග්‍රාමීය කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ කර ගනිමින් මෙම වැඩසටහනේ දේශීය අගය වැඩි කර ගැනීමටත් සැලසුම් කර තිබෙනවා.

මෙම සමස්ත ක්‍රියාවලිය තුළින් දැනට නිපදවන ජල ප්‍රමාණය දවසකට ඝන මීටර් මිලියන 2.1ක සිට, ඝණ මීටර මිලියන 4.4 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කරනවා. ලංකාව පුරා ජලනල කිලෝමීටර් 40,000 ක් එලීම තුළින් අලුතින් පවුල් ලක්ෂ 35කට ජලය ලබාදීමට සැලසුම් කර තිබෙනවා. මේ අනුව, ප්‍රජා ජල ව්‍යාපෘති 263ක් ද, දැනට නිපදවන ජලය උපරිම ලෙස භාවිතා කිරීම සඳහා ව්‍යාපෘති 171 සහ අළුත් ව්‍යාපෘති 40 ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයට වෙන් කර ඇති රුපියල් බිලියන 125ට අමතරව බැංකු මූල්‍ය පහසුකම් මගින් රුපියල් බිලියන 75ක් ලබාදීමට භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීමටද යෝජනා කරනවා.

## විදේශ වෙළදාම හා ජාතික නිෂ්පාදන ආර්ථිකය

ගරු කතානායකතුමනි,

1977ට පෙර වසර 20ක් පමණ පැවති වැසුණ ආර්ථිකයේත්, ඉන්පසු ක්‍රියාත්මක වූ විවෘත ආර්ථිකයේත් සීමාවන් පිළිබඳ අපට පුළුල් අත්දැකීම් තිබෙනවා. බොහෝ රටවල් බහුපාර්ශවිකව, ද්විපාර්ශවිකව හා ඒක පාර්ශවිකව මෙම අත්දැකීම් තුළින් දේශීය නිෂ්පාදන පුළුල් කෙරෙන ප්‍රතිසංස්කරණ වලට ප්‍රවේශ වී තිබෙනවා. ලොවපුරා පැතිර ඇති කොවිඩ් වසංගත තත්ත්වය තුළ පෞද්ගලික අංශයේ සීමාවන්ද මතු වී පෙරටත්

වඩා වැඩි අවධානයකින් පෞද්ගලික හා රාජ්‍ය අංශවල කාර්යභාරයන් පෙළගැස්වීමත් අද බොහෝ රටවල සිදුවෙනවා.

පසුගිය කාලය තුළ අපේ රට අත්සන් කර ඇති නිදහස් වෙළඳ ගිවිසුම් (Free Trade Agreements) වලින් අපේ රටට ලැබී ඇති ප්‍රතිලාභ ගැන අපට සෑහීමකට පත් විය නොහැකියි. මෙම ගිවිසුම් නිසා නිෂ්පාදන ක්ෂේත්‍ර රාශියක් පසුබෑමට ලක්වී තිබෙන අතර නිෂ්පාදකයින් ව්‍යාපාරිකයන්වීම වෙනුවට ආනයනකරුවන් බවට පරිවර්තනය වීමක් සිදු වී තිබෙනවා.

රට මුහුණ පා ඇති  වෙළඳ හිඟයන්ටද  මේ ගිවිසුම් නිසා විසඳුම් ලැබී නැහැ. ආසියාවේ ප්‍රධාන ආර්ථිකයන් වන ඉන්දියාව, චීනය හා ජපානය සමඟ පවත්නා වෙළඳාම තුළ පමණක් අප ඩොලර් මිලියන 9,000ට ආසන්න වෙළඳ හිඟයකට මුහුණ දී තිබෙනවා. මේ හා සමාන වෙළඳපළක් අප රටේ නිපදවන තේ, ඇඟළුම්, රබර්භාණ්ඩ, කුරුඳු, ගම්මිරිස්, මැණික්, විදුලි කාර්මික නිෂ්පාදන සඳහා මෙම ප්‍රධාන ආර්ථිකයන් 3 තුළින් ලබා ගැනීමට අප කටයුතු කළ යුතු වෙනවා. විදේශ හා වෙළඳ අමාත්‍යාංශවල මූලික වගකීම හා කාර්යභාරය මෙය බව අප විශ්වාස කරනවා.

දියුණු රටවල ඇති උසස් තාක්ෂණය හා උපකරණ මෙන්ම අපේ රටේ නිෂ්පාදනයන්ට ඉහළ වටිනාකම් දිය හැකි අපනයන සංවර්ධනය සඳහා රටතුළ නිපදවා ගත නොහැකි සුවිශේෂිත අමුද්‍රව්‍ය හා අන්තර් භාණ්ඩ ආනයනය කිරීමට අපගේ වෙළඳ ප්‍රතිපත්තිය සකස් විය යුතුයි. අප රටට ආවේනික තේ, කුරුඳු, ගම්මිරිස් වැනි කෘෂි නිෂ්පාදනයන්, පාරම්පරික විසිතුරු හා පරිභෝගික භාණ්ඩත්, වසවිසෙන් තොර එළවළු, ධාන්‍ය, පළතුරු වැනි අපනයනයන් සඳහා විශේෂ වෙළඳපළ පුළුල් කරගත හැකි ද්විපාර්ශ්වික භාණ්ඩ වෙළඳ ගිවිසුම් සකස් කර ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය හා විදේශ අමාත්‍යාංශය පෙරමුණ ගත යුතු වෙනවා. ඒ සඳහා අපේ නව විදේශ තානාපතිවරු යෙදවීමට කටයුතු කර තිබෙනවා. බැංකු, මූල්‍ය හා විවිධ වෘත්තීමය අංශ ඇතුළත් සේවා අංශය විවෘත කිරීමට අපට හැකියාවක් නැහැ. එබැවින් නිදහස් වෙළඳ ගිවිසුම් සකස් කර ගත යුත්තේ කාර්මික සංවර්ධනයක් ඇතිවන පරිදිත්,  අපනයන ආදායම වැඩි කිරීමටත්, රට තුළ නිෂ්පාදනය කළ හැකි ආනයන ආදේශන නිපදවීම මගින් විදේශ විනිමය

ඉතිරිකර ගැනීමටත් හැකි වන පරිදි තුළනාත්මක වෙළඳ ප්‍රතිපත්තියක් අනුගමනය කරමිනුයි.

ගරු කතානායකතුමනි,

නිෂ්පාදන ආර්ථිකය ඉහත කී අරමුණු ඉටුවන අයුරින් සකස් කර ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කෙරේ.

1. දේශීයව නිපදවිය නොහැකි කෘෂිද්‍රව්‍ය හැර අනෙකුත් කෘෂි භාණ්ඩ ආනයනය සීමා කිරිම (Negative List).
2. දේශීය නිෂ්පාදන සැපයුම හා ඉල්ලුම තුළණය කිරීමට අදාළ තෝරාගත් කෘෂි නිෂ්පාදන සඳහා විශේෂ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක කිරීම.
3. ආනයන හා අපනයන සඳහා දේශීය නිෂ්පාදනවලට අවශ්‍ය ආරක්ෂණය සඳහා CESS බදු ක්‍රියාත්මක කිරීම.
4. භාණ්ඩ අපනයන හා දේශීය කර්මාන්තවල එකතු කළ අගය වැඩි නිෂ්පාදනයන්ට යොමුවීම දිරිගැන්වීම සඳහා දේශීයව ලබාගත නොහැකි අමුද්‍රව්‍ය, නවීන තාක්ෂණික යන්ත්‍ර හා උපකරණ හා ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා තිරුබදු ඉවත් කිරීම.
5. ඉහත සඳහන් භාණ්ඩ ගනයන්ට අයත් නොවන සමස්ථ ආනයන භාණ්ඩ සියයට 0, 10 සහ 15 වශයෙන් තිරුබදු කාණ්ඩ 3ක් යටතේ වර්ගීකරණය කිරීම.
6. යම්කිසි භාණ්ඩයක් ආනයනයේදී VAT බද්දෙන් නිදහස් කර ඇත්නම් එම භාණ්ඩයේ දේශීය නිෂ්පාදනයටද එය අදාළ කිරීම.
7. ආනයන අපනයන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා එක් සේවා මධ්‍යස්ථානයක ඉටු කිරීම සඳහා විවිධ නියාමන ආයතනවලින් ඉටුකරන සේවා ආනයන අපනයන දෙපාර්තමේන්තුව මගින් ඉටුකිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු වල නිළධාරින් ආනයන අපනයන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම.
8. බතික් හා විලාසිතා ජාතික කර්මාන්තයක් ලෙස දියුණු කිරිම සඳහා බතික් නිෂ්පාදන ආනයනය දේශීය සංකේත අංක යටතේ තහනම් කිරීම.
9. දේශීය හා විදේශීය ඇඟළුම් නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් කිරීම සඳහා, වැඩි වටිනාකමින් යුත් ඇගළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදනයන්, විදේශිකයන්ගේ හා

සංචාරකයන්ගේ වෙළඳපළක් ලෙස දේශීය ඇඟළුම් කර්මාන්තය දියුණු කිරීම සඳහා එම කර්මාන්තයට අවශ්‍ය ආනයන ලිහිල් කිරීම හා නව තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

10.රත්නපුර ජාත්‍යන්තර මැණික් කර්මාන්ත නගරය සංවර්ධනය හා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය වැඩි දියුණු කිරීම.

11.දේශීය වෙළඳපළ අවශ්‍යතා සඳහා ආනයනය මත රඳා පවතින බහුජාතික සමාගම් සිය නිෂ්පාදන අපනයන වෙළඳපළ කරා දිරිගැන්වීම සඳහා 2021ට පෙර එසේ අපනයනය කරනු ලබන ප්‍රමාණය සියයට 30කටත්, 2023ට පෙර සියයට 50 දක්වාත් වැඩි කරන්නේ නම් ඔවුන්ගේ ලාභාංශ සඳහා අය කරන බද්ද පිළිවෙළින් සියයට 25න් හා සියයට 50න් අඩු කිරීමට යෝජනා කරනවා.

12.එම සමාගම් ආනයනය කරනු ලබන ප්‍රමාණයේ විදේශ විනිමය ප්‍රමාණයක් විදේශ මූලාශ්‍ර වලින් ලබාගෙන දේශීය බැංකුවල සංචිත පවත්වා ගැනීම දිරිගැන්වීම සඳහා එම තැන්පතුවල පොලී ආදායම බදු වලින් නිදහස් කිරීමටද යෝජනා කරනවා.

13.ඛණිජ වැලි, පොස්ෆේට්, පොහොර, මිනිරන් ආදී සැගවුණ කර්මාන්ත ඉහළ වටිනාකමින් යුත් අපනයන කර්මාන්ත ලෙස දියුණු කිරීම සඳහා නැනෝ තාක්ෂණ ආයතනයට සම්බන්ධවන දේශීය ව්‍යාපාරිකයන්ගේ වියදම පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස බදු වලින් අඩු කිරීමට යෝජනා කරනවා. මෙම නිෂ්පාදනවල ශ්‍රී ලංකා අනන්‍යතාවය ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

14.කොසු, ඉදල්, පාපිසි ඇතුළු ගෘහ අවශ්‍යතා මෙන්ම පොල් ආශ්‍රිත කර්මාන්ත, කෘෂිකාර්මික හා පාරිභෝගික අවශ්‍යතා ඇතුළු රබර් නිෂ්පාදන, ගොඩනැගිලි ද්‍රව්‍ය, කාර්යාල හා ගෘහභාණ්ඩ, ප්‍රධාන කර්මාන්ත ලෙස ආයෝජන දිරිගැන්වීම් ලබාදීමටද යෝජනා කරනවා.

15.ධීවර, සංචාරක හා නාවික ක්ෂේත්‍රයේ පුළුල් වෙමින් පවතින ඉල්ලුමත්, දේශීය නිෂ්පාදකයනගේ උසස් නිෂ්පාදන හැකියාවත් නිසා වැඩිදියුනු කළ හැකි බෝට්ටු හා නැව් නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා වෙන් වූ නැව් තටාකාංගන,

අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුකම්, දිගුකාලීන ණය පහසුකම් ලබාදීමටත්, දේශීය බෝට්ටු හා නැව් නිෂ්පාදන සඳහා වසර 7ක බදු විරාමයයක් ලබාදීමටත් යෝජනා කරනවා.

## විදේශ ආර්ථික සබඳතා

විදේශ අමාත්‍යාංශය හා අප රටේ විදේශ දූත මණ්ඩල සම්ප්‍රදායික රාජ්‍යතාන්ත්‍රික කටයුතු වලින් ඔබ්බට ගොස් අප රටේ විදේශ රැකියාවල නිරතවන්නන්, ව්‍යාපාරවල නිරතවන ව්‍යාපාර ප්‍රජාව, හා විවිධ අවශ්‍යතාවන්ට විදේශ ගතවන අපේ ජනතාවගේ අභිලාෂයන් ඉටු වන පරිදි ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය පියවරයන් රාශියක් කෙරෙහි රජයේ අවධානය යොමු කර තිබෙනවා. විවිධ ආයතනවලින් විදේශ රටවලදී කළයුතු සේවාවන් සඳහා යොදා ඇති කාර්යමණ්ඩල, විදේශ දූත මණ්ඩල ප්‍රධානීන්ගේ ඍජු පාලනයට හා සම්බන්ධීකරණයට ලක් කිරීම ඉන් ප්‍රධාන තැනක් ගනු ලබනවා. ලෝක ආර්ථික රටාවේ සිදුවන විවිධ වෙනස්කම් තුළ අපේ රටේ අපනයන, සංචාරක, විදේශ රැකියා හා ආයෝජන සඳහා ඇති ඉඩ ප්‍රස්ථා පූර්ණ වශයෙන් උකහා ගත හැකි පරිදි ආර්ථික හා වෙළඳ සබඳතා (Economic Diplomacy) කෙරෙහි විදේශ දූත මණ්ඩල පුළුල් දායකත්වයක් දැරීම අවශ්‍ය වෙනවා.

විවිධ අවස්ථාවල ඇති කරගෙන ඇති ද්විපාර්ශ්වික ගිවිසුම් සමාලෝචනයට ලක්කර කාලීන ප්‍රවණතාවන්, දේශීය ආර්ථිකයට මෙන්ම රටේ ජාතික ආරක්ෂාව හා ස්වාධීනත්වය තහවුරු වන පරිදි රජයේ මිත්‍රශීලි හා නොබැඳි විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විදේශ දූත මණ්ඩලවල ප්‍රධාන වගකීමක් වශයෙන් කාර්යසාධන ඇගයීමකට ලක් කිරීමටද අදහස් කරනවා. නැඟී එන ආසියා පැසිපික්, අප්‍රිකානු, මැදපෙරදිග හා බටහිර රටවල වෙළඳපළ අවස්ථාවන් වලින් ප්‍රයෝජන ගැනීමටඑම රටවල අප රටේ ව්‍යාපාරිකයන් මුහුණ දෙන බාධාවන් (Trade Barriers) ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 750ක අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමටද යෝජනා කරනවා.

## රාජ්‍ය ව්‍යාපාර නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීම

රාජ්‍ය ව්‍යාපාර නඩත්තුව සඳහා භාණ්ඩාගාරය විසින් විශාල මුදලක් වාර්ෂිකව වැය කරනු ලැබුවත් බොහෝ ව්‍යාපාර ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට දක්වන දායකත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකියි. 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරය මේ ආයතන වෙනුවෙන් වැය කර ඇති පුනරාවර්ථන වියදම රුපියල් බිලියන 42කට අධික වන අතර ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 20 ඉක්මවා තිබෙනවා. මීට අමතරව බොහෝ ආයතන රාජ්‍ය බැංකු වලින් හා භාණ්ඩාගාර ඇපකර මතද යැපෙන ප්‍රවණතාවය වැඩි වී තිබෙනවා. ශ්‍රී ලංකා ගුවන් සේවය වැනි ජාතික උපායමාර්ගික වශයෙන් වැදගත් වන ව්‍යවසායන් හැර බොහෝ ව්‍යාපාර රාජ්‍ය බැංකු හා භාණ්ඩාගාර ඇප මත යැපීම අවම කර ජනතාවට බරක් නොවන ජාතික ව්‍යාපාර වීම අවශ්‍යයි. රාජ්‍ය ආයෝජන ප්‍රමාණය රුපියල් ට්‍රිලියන එකක් නැත්නම් රුපියල් බිලියන 1,000ක් වන විට රාජ්‍ය අංශයේ ඉදිකිරීම් හා සේවා අංශවලට, ඉන් කොටසක් හෝ ව්‍යාපෘති කිරීමට යෙදවීමෙන් පුනරාවර්ථන හා ප්‍රාග්ධන පැවරීම් අඩුකර ගත හැකියි.

භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙනුවට අවම වශයෙන් එම මුදල් මෙන් දෙගුණයකට වැඩි රජයේ විවිධ සංවර්ධන වැඩසටහන් එම ආයතන මගින් ක්‍රියාත්මක කිරීම යෝජනා කරනවා. උදාහරණ වශයෙන් කොලොන්නාව රජයේ වැඩපළ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය ඉදිකිරීම් සංස්ථාව, මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය, දුම්රිය ඉංජිනේරු කාර්යාංශය, ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව වැනි ඉදිකිරීම් අංශයේ රාජ්‍ය ආයතනවලට රජයේ විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකියි. එබැවින් 2021 වර්ෂය සඳහා ඇති වර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවට රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ඇති ව්‍යාපෘති එම ආයතන මගින් ක්‍රියාත්මක කරමින් ආදායම් උපදවන ආයතන බවට පත් කිරීමට යෝජනා කරනවා. උප කොන්ත්‍රාත් පෞද්ගලික අංශයට දීමේ අතරමැදි කාර්යය මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවතක්සේරු කිරීමෙන් රාජ්‍ය ආයතන වැලකි සිටීමටද පියවර ගනු ලබනවා.

## වාහන කර්මාන්තය

පසුගිය පස්වසර තුළ ඩොලර් මිලියන 5,318ක් පමණ විදේශ විනිමය යොදා ආනයනය කළ වාහන වල වටිනාකම එම කාලය තුළ අප ලබාගත් ණය ප්‍රමාණයෙන් සියයට 21ක්

තරම් විශාල ප්‍රමාණයක්. දේශීය වෙළඳපළ මේ සා විශාල වුවත්, අඩුම වශයෙන් අපනයනය සඳහා වාහන නවීකරණය හෝ වාහන එකලස් කිරීමේ කර්මාන්තයක්වත් දියුණු කර නැහැ. රට තුළ මේ වන විට පවත්නා වාහන තොගය අලුත්වැඩියා කළ හැකි රජයේ වාහන හා , ගිලන් රථ ප්‍රමාණයද අති විශාලයි. මෙම වාහන අලුත්වැඩියා කිරීමට මෙන්ම වාහන එකලස් කිරීම් ඇතුළු මෝටර් රථ කර්මාන්තයේ ව්‍යාපාරිකයින් දිරිගැන්වීමට නව නිෂ්පාදන සඳහා අවශ්‍ය අමතර කොටස් සඳහා පනවා ඇති ආනයන බදු අඩු කිරීමට යෝජනා කරනවා. රජයේ අයතනවල වාහන අලුත්වැඩියා කිරීමට ආයෝජනය කරන ව්‍යාපාරිකයින් සඳහා එම ව්‍යාපාර වලට බදු සහන සැලසීමටද යෝජනා කරනවා. එසේම දුම්රිය මැදිරි නිෂ්පාදනය දේශීය කර්මාන්තයක් වශයෙන් සංවර්ධනය කිරීමටද යෝජනා කරනවා.

**ඉදිකිරීම් කර්මාන්තය**

ජාතික ආර්ථිකයේ සියයට 10කට වඩා වැඩි දායකත්වයක්ව පැවති ඉදිකිරීම් කර්මාන්තය යළි නගා සිටුවීම, ඉදිකිරීම් හා ආශ්‍රිත කර්මාන්ත, වෘත්තීමය සේවා, නව රැකියා, ජීවනෝපාය මාර්ග සංවර්ධනය සඳහා බෙහෙවින් දායක වෙනවා. ඉදිකිරීම කර්මාන්තය සඳහා ඇති විවිධ ආයතනික බලපත්‍ර ලබාගැනීමේ ක්‍රම සරල කර එම කර්මාන්තය වටා ඇති සැපයුම් ජාලය කාර්යක්ෂම කිරීමට රජය පියවර ගෙන තිබෙනවා.

2020-2024 කාලය තුළ නිවාස, මාර්ග, වාරිමාර්ග, ජල සම්පාදනය ආදී ව්‍යාපෘතින් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තක්සේරුවක් ජනාධිපති කාර්යසාධන බලකාය විසින් සකස් කර තිබෙනවා. ඒ අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ගල්, වැලි, පස් ආදී අමුද්‍රව්‍යයන් පරිසර හානි සිදු නොවන පරිද්දෙන් තෝරාගත් ස්ථාන වලින් ලබා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබනවා. හඳුනාගත් කැනීම් මධ්‍යස්ථාන සියල්ල මාර්ග සංවර්ධන අධිකාරියට පවරනු ලබන අතර එමගින් එම ද්‍රව්‍ය අතරමැදීන්ගෙන් තොර මිල ගනන් වලට ඉදිකිරීම් ක්ෂේත්‍රයට ලබාදීමට කටයුතු කරනවා. එම කැණීම් ස්ථාන පරිසර හිතකාමීව දියුනු කිරීමටද මාර්ග සංවර්ධන අධිකාරියට පැවරෙනවා. විශාල පරිමාණයේ නිවාස ව්‍යාපෘති හා අධිවේගී මාර්ග සඳහා දේශීයව සපයා ගත නොහැකි සිමෙන්ති, ප්‍රිමික්ස්, වානේ කම්බි, බිටුමන් වැනි අමුද්‍රව්‍ය

ආනයන බදු නොමැතිව තොග වශයෙන් ලබාගැනීමට සැලසුම් කර ඇත්තේ එමගින් සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කර්මාන්තයට සැපයුම් හිඟයක් ඇති නොවන පරිදි හා තරඟකාරී මිල ගනන් පවත්වා ගැනීම සඳහායි.

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් ලබා ගැනීමට වෘත්තීය අධ්‍යාපන ආයතන කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා.
විදේශ රටවල නුපුහුණු ශ්‍රමය මත ඉදිකිරීම් කර්මාන්තය තවදුරටත් පවත්වා ගත නොහැකි බැවින් බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ශ්‍රමිකයින් ලබා දීමට සැලසුම් කර තිබෙනවා. එබැවින්, රජය විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමස්ත පිරිවැය අඩුකිරීම සඳහා සැපයුම් ජාලය සැලසුම් කර තිබෙනවා.

රාජ්‍ය අංශයේ ව්‍යාපෘති වලට සම්බන්ධ වනසේ ඉදිකිරීම්කරුවන්ගේ ගෙවීම් අඛණ්ඩව සිදු කිරීම සඳහා සහතික කරන ලද බිල්පත්වල වටිනාකමින් සියයට 90ක් බැංකු වලින් ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම්ද (Certiifed bills disconting) යෝජනා කරනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නව තාක්ෂණ හා යන්ත්‍රෝපකරණ ආනයන බදු සියල්ලන්ගෙන් නිදහස් කිරීමට යෝජනා කරනවා. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා කල්බදු කුලී අයකර ගැනීමට කල්බදු ඇප ක්‍රමයක් (Treasury guarantee for leasing companies) ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අපතේ යන අමුද්‍රව්‍යයන් ප්‍රතිචක්‍රීකරණය කරමින් නැවත යොදා ගැනීමේ ආයෝජන දිරිගැන්වීම සඳහා තෝරාගත් ප්‍රතිචක්‍රීකරණ වැඩබිම් සඳහා ආයෝජකයන්ට වසර 10ක පූර්ණ බදු විරාමයක් යෝජනා කරනවා.

## නාගරික නිවාස (Urban Townships)

ඉදිරි වසර 5-10 කාලය තුළ නැගී එන කොළඹ වරාය නගර කලාපය හා කොළඹ හා තදාසන්න ප්‍රදේශ මෙන්ම දිවයිනේ ප්‍රධාන නගර ආශ්‍රිතව සිදුවන සංවර්ධනයට අවශ්‍ය ශ්‍රම බලකායට අවශ්‍ය නිවාස සංකීර්ණ හා ආශ්‍රිත සමාජීය පහසුකම් පුළුල් කිරීම අපගේ සංවර්ධන වැඩපිළිවෙළේ ප්‍රමුඛතාවක්. එම ජාතික ආයෝජන වැඩපිළිවෙල මගින් පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්ත, සේවා සැපයුම් හා වන සනත්වය මෙන්ම

කැළි කසල කළමනාකරණය කිරීමේ ආයෝජන අවස්ථාවන් පුළුල් කිරීම සඳහා කරනු ලබන සාමූහික ආයෝජනයක්. මෙම වැඩපිළිවෙළ යටතේ අඩු හා මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස 50,000ක අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ ඉදිකිරිමට නාගරික සංවර්ධන අධිකාරිය දැනටමත් ආරම්භ කර තිබෙනවා. එම නිවාස ලබාගැනීම සඳහා වසර 25ක ආපසු ගෙවීමේ කාලයක් තුළ සියයට 6.25ක වාර්ෂික ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා.

## මූල්‍ය සමාගම් ප්‍රතිසංස්කරණ

ගරු කතානායකතුමනි,

එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් (ETIFL) සමාගම සම්බන්ධයෙන් සිදු වුයේ යැයි කියන අක්‍රමිකතා පරීක්ෂා කිරීමට පත්කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව එම සමාගම හා අනුබද්ධිත සමාගම්වල ක්‍රියාකාරීත්වයට එරෙහිව නීතිමය පියවර කඩිනමින් ගැනීමට නීතිපතිවරයා වෙත යොමු කර තිබෙනවා.

ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව මගින් කාලාන්තරයක් තිස්සේ සමස්ත මූල්‍ය සමාගම් ක්ෂේත්‍රය මෙන්ම වක්‍රාකාරයෙන් මූල්‍ය, බැංකු හා සමස්ථ ආර්ථික ක්‍රියාවලියම අවධානමට ලක් කරන හා මහජනතාවට මූල්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ඇති විශ්වාසනීත්වය බිඳවැටෙන අක්‍රමිකතා නතර කිරීමේ දැඩි අවශ්‍යතාවය පෙන්වා දී තිබෙනවා.

එබැවින්, මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය සමාගම් අධීක්ෂණය සඳහා ඇති දෙපාර්තමේන්තුව මුළුමනින්ම ප්‍රතිසංවිධානය කර මූල්‍ය සමාගම් නියාමනය සඳහා ශක්තිමත් ආයතනික ව්‍යුහයක් සකස් කිරීමට නිර්දේශ කර තිබෙනවා. එම කොමිෂම විසින් මහා බ්‍රිතානයේ හා ඉන්දියවේ එම ක්ෂේත්‍ර නියාමන නීති රාමුව පිලිබඳ පුළුල් අධ්‍යනයක් ඉදිරිපත් කර තිබෙනවා. එබැවින්, එවැනි නීතිමය රාමුවක් සකස් කිරීමට විශේෂඥ කමිටුවක් පත්කර, අදාල කෙටුම්පත් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට මා අදහස් කරනවා.

මූල්‍ය සමාගම් ක්ෂේත්‍රයේ දැනට වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම් ශක්තිමත් වන අයුරින් පවත්නා ආයතන ඒකාබද්ධ කර ගැනීම අවශ්‍ය වී තිබෙනවා. 2014 වර්ෂයේදි අයවැය විසින් එවකට මූල්‍ය සමාගම් 21ක් මූල්‍ය සමාගම් 10ක්

තුළ ඒකාබද්ධ වීමක් සිදුකිරීම නිසා මුල්‍ය ක්‍රමය ස්ථාවර කිරීමට අපට හැකිවුණා. කෙසේ වුවද, පසුගිය වසර 5 තුළ මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමත්, ආර්ථිකමය වශයෙන් ඇතිවුණ පසුගාමීත්වයත් තුළ ETI වැනි මුල්‍ය සමාගම් රාශියක් වසා දැමීමට සිදු වී තිබෙනවා. ඒවා ගොඩනැගීමට අතිරේක ප්‍රාග්ධනය හෝ වෙනත් ආයතනවලට පැවරීම මගින් ඇතිවන මූල්‍ය පීඩනය අධික වී ඇති නිසා ඒවාට වගකිවයුත්තන්ට නීතිමය පියවර ගත යුතු වෙනවා. රජයේ එකම අරමුණ අසරණ වූ තැන්පත්කරුවන්ගෙන් බහුතරයකට සරණවීමයි. මේ අනුව මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් අරමුදලේ ප්‍රතිමූල්‍ය තුළ මෙම තැන්පත්කරුවන්ට පහසුකම් සලසනවා.

අප රටේ ඇති මුල්‍ය සමාගම් 58න් රුපියල් බිලියන.20ට වඩා වත්කම් ඇත්තේ සමාගම් 20කට පමණයි. මෙම මුදල් සමාගම් 20 ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන සමාගම විසින් පවත්වාගෙන යනු ලබන මහ බැංකුව විසින් අවලංගු කර නොමැති, අනුබද්ධිත මුදල් සමාගම් ප්‍රධාන සමාගම සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා කරනවා. එමෙන්ම, වාණිජමය බැංකු ශක්තිමත් කිරීම සඳහා එම බැංකු විසින් පවත්වාගෙන යනු ලබන මුල්‍ය සමාගම් එම බැංකු හා ඒකාබද්ධ කිරීමටද යෝජනා කරනවා. මෙම බැංකු හා මුල්‍ය සමාගම් ශක්තිමත් කිරීම දිරිගැන්වීමක් වශයෙන්, අත්පත් කරගැනීමේදි කරනු ලබන ආයෝජන වියදම් බදු වලින් අඩුකර ගැනීමේ වියදම් ලෙස සැලකීමටද යෝජනා කරනවා. මුල්‍ය ක්ෂේත්‍රයේ විවිධත්වය පුළුල් කිරීම සඳහා වාණිජ බැංකු වලට ආයෝජන බැංකු කටයුතු කිරීමට පවත්නා බැංකු නීති සංශෝධනය කර පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමටත් යෝජනා කරනවා.

නිවාස හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන දේපල සමාගම හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඒකාබද්ධ කර විශේෂ ජාතික සංවර්ධන බැංකු සංස්ථාවක් ඇතිකිරීමට යෝජනා කරනවා (National Development Banking Corportion).

## අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ

"Justice delayed is justice denied" යන කියමන නීතියේ පොදු පිළිගැනීමක් (Legal Maxim). එහි සරල අදහස වන්නේ නීති පද්ධතියේ ප්‍රමාදයන් හේතුවෙන්, නීති

ඊකවරණය අහිමි වීමයි. නීතියේ ප්‍රමාදයන්, ව්‍යාපාරික කටයුතුවලට අවිනිශ්චිතභාවයක් ඇති කරන අතර ආයෝජන පරිසරයට අහිතකර බලපෑම්ද, සමාන්‍ය ජන ජීවිතයට බලපාන නොයෙක් දූෂණ හා අක්‍රමිකතාවන් ඇති කිරීමටද හේතු වෙනවා. ඊට අමතරව අධිකරණ පද්ධතියට ඇති විශ්වසනීත්වය කෙරෙහිද අහිතකර බලපෑම් ඇති කරනවා. සිර ගෙවල්වල සිටින අති බහුතරයක් දෙනා ඒවායේ බොහෝ විට කල්ගත කරන්නේ නීතියේ ප්‍රමාදයන් නිසා බව පෙනී යනවා.

තවද, නඩුහබ අවසන් වීමට ඉතා දිර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් රැකියා හා ආදායම් මාර්ග අහිමිවීම, අසමගිකම් හා අපරාධ වැඩිවීම යනාදි අනිසි විපාකද ඇතිවෙනවා. එහෙයින්, නීතිගරුක සමාජ ආර්ථික ක්‍රමයක් සකස් කර ගැනීම සඳහා එවැනි නීති ප්‍රමාදයන් වලක්වා ගැනීමට සමස්ථ නීති ක්ෂේත්‍රයේ කැපවීම අවශය වී තිබෙනවා.

මෑතදී සම්මත වූ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මෙයට පිලියමක් ලෙස උපරිමාධිකරණයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩිකිරීමට කටයුතු කරනු ලැබූ අතර, අතපසු වී ඇති නීති ප්‍රතිසංස්කරණ සඳහා ගනු ලැබූ මෙම ප්‍රධාන පියවරේ කොටස්කරුවන් ලෙස එයට පක්ෂව ඡන්දය දුන් මෙම උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීවරුන් ආඩම්බර විය හැක්කේ තමන්ගේ ඡන්දය මහජන යහපත වෙනුවෙන් ප්‍රකාශ කිරීම නිසයි. මෙසේ උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරනු ලැබුවේ 1978ට පසුවයි. එනම් වසර 42කට පසුවයි.

මෙම වැඩි කිරීමත් සමඟ, ශ්‍රේෂ්ඨාධිකරණයේ වසර ගනනක් ගොඩගැසී ඇති ජනතාවගේ මූලික අයිතිවාසිකම් වලට බලපාන විවිධ නඩු හා අභියාචනයන් කඩිනමින් නිම කිරීමේ අවස්ථාව උදාවී තිබෙනවා. මෙයට අමතරව අනෙකුත් අධිකරණවල විනිශ්චයකාරවරුන් හා කාර්ය මණ්ඩල ප්‍රමාණය තවදුරටත් අවශ්‍ය පරිදි වැඩි කිරීමටත්, එම නඩු කඩිනමින් විසදීමට අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීමටත්, වසර 3ක කඩිනම් වැඩපිළිවෙළ සඳහා රුපියල් මිලියන 20,000ක ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

පසුගිය රජය විසින් දේශපාලන පලිගැනීම් සඳහා විශේෂ ඉහළ උසාවි පිහිටුවීමට ගත් පටු දේශපාලන ප්‍රතිසංස්කරණ මෙන් නොව, උසාවි අලුත්වැඩියා කිරීම, පුළුල් කිරීම,

නවීන පහසුකම් හා උපකරණ සැපයීම යනාදිය කඩිනමින් කිරීමට රජය පියවර ගනු ලබනවා. උපරිමාධිකරණය පුළුල් කිරීම නිසා ශ්‍රේෂ්ඨාධිකරණයට හා අභියාචනාධිකරණයට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ලබාදීම අවශ්‍ය වන අතර, එය මෙම වර්ෂය තුළම අරම්භ කිරීමටද මා යෝජනා කරනවා. විශේෂඥ උපදේශක කණ්ඩායම් 10ක දායකත්වයෙන් රටේ පවත්නා වාණිජ නීතිය, සිවිල් නීතිය හා අපරාධ නීතියට අදාළ පනත් 60ක් පමණ සංශෝධනය කිරීමට අවශ්‍ය කෙටුම්පත් 2021 මුල් මාස 3 තුළ මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කිරීමට අදහස් කරනවා.

තවද, 2007 සම්මත වූ සමාගම් පනතට, කාලීන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කළ යුතු සංශෝධනයන් ජනවාරි මස තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ

1977 ට පෙර අපේ රටේ මෙන්ම දියුණුවන රටවල් සියල්ලම පාහේ අනුගමනය කළ වැසුණු ආර්ථික හා දැඩි පාලන හා නියාමන ප්‍රතිපත්තිවලින් බොහෝ රටවල් විවෘත ආර්ථික හා වෙළඳපළ මත රඳාපවතින ප්‍රතිපත්තිවලට නැඹුරු වී තිබුණත් පසුගිය වසර කීපය තුළ එම ගෝලීය ආර්ථික රාමුව තුළ ශක්තිමත් ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා ගත හැකි ප්‍රතිසංස්කරණවලට ප්‍රවේශ වී තිබෙනවා.

වාණිජමය කටයුතු සඳහා පෞද්ගලික අංශය රාජ්‍ය අංශයට වඩා ඉදිරියෙන් සිටියත්, රාජ්‍ය අංශයේ ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම එයට විකල්පයක් ලෙස අප තෝරා ගන්නේ නැහැ. අපගේ ප්‍රතිපත්තිය වී ඇත්තේ පෞද්ගලික ව්‍යාපාර කළමනාකරණ නිදහස රාජ්‍ය ව්‍යාපාර වලට ලබාදී, රාජ්‍ය අංශයේ මැදිහත්වීම තුළ වෙළඳපළ තරඟකාරීත්වය මෙන්ම පාරිභෝගික හා සේවාලාභීන්ගේ සුභසාධනය වැඩි කිරීමයි. එබැවින්, විවිධ ක්ෂේත්‍රවල ඇති රාජ්‍ය ව්‍යාපාරවල වාණිජමය නිදහස තහවුරු කිරීමට අවශ්‍ය රාජ්‍ය කළමනාකරණ ස්වාධීනත්වය ලබාදීමට නීති රාමුවක් ඉදිරිපත් කිරීමට යෝජනා කරනවා.

විවිධ නීති රාමු යටතේ ඇතැම් රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල වලට එකම සේවා ස්ථානයක සිය මුළු සේවා කාලයම ගත කිරිමට සිදු වී තිබෙනවා. වෘත්තීමය හා

තාක්ෂණික වශයෙන් ඔවුන්ගෙන් ලබා ගත හැකි දායකත්වය මෙන්ම සේවක සුරක්ෂිතභාවය හා සුභසාධනයද මේ නිසා සීමා වී තිබෙනවා. එබැවින්, සංවෘත රාජ්‍ය සේවා (close service) ආයතනවල සේවකයින්ට පවත්නා සේවා කොන්දේසි තුළ සේවා අවශ්‍යතාවයන් අනුව වෙනත් ආයතනවලට අනුයුක්ත කළ හැකි නීති රාමුවක් හඳුන්වා දීමට මුදල් පනත සංශෝධනය කිරීමට මා යෝජනා කරනවා.

මෙමගින් දැනට වැසුන සේවා ආයතනවලට කොටු වී ඇති සේවකයින්ට තමාට වෘත්තීමය උනන්දුවක් ඇති වෙනත් රාජ්‍ය ආයතනයක හෝ තම ගම් ප්‍රදේශවලට ආසන්න ආයතනයක රැකියාව කිරීමේ අවස්ථාවන් ඇති කිරීමට අපේක්ෂා කරනවා. මෙමගින් සේවක තෘප්තිය සහතික කිරීමට හැකි වන අතර එවන් සේවකයන් කාර්යක්ෂම ලෙස සේවාවේ යොදා ගැනීමටද හැකි වෙනවා.

එකිනෙකට සම්බන්ධ වූ කාර්යයන් සඳහා වෙන වෙනම ආයතන පවත්වා ගැනීම නිසා එම ක්ෂේත්‍රවල සංවර්ධන කටයුතුවලට විශාල බාධාවක් මෙන්ම අධික වියදමක් දැරීමටද සිදුවී තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය සඳහා පවත්නා ආයතන 5 සංචාරක ප්‍රවර්ධන අධිකාරිය ලෙසත්, පොල් කර්මාන්තය සඳහා ඇති ආයතන 4 පොල් වගා හා ආශ්‍රිත කර්මාන්ත සංවර්ධන අධිකාරිය වශයෙනුත් ඒකාබද්ධ ආයතනික ව්‍යුහයක් ඇති කිරීමට අපේක්ෂා කරනවා. පර්යේෂණ සඳහා වැයවෙන සම්පත් උපරිම ඵලදායිතාවයකින් යුතුව කළමනාකරණය කිරීම සඳහා ජාතික පර්යේෂණ සභාවේ අනුබද්ධිත ආයතන ලෙස පර්යේෂණ ආයතන ක්‍රියාත්මක කිරීමටද අවශ්‍ය වී තිබෙනවා. පොහොර ආනයනය හා බෙදාහැරීම සඳහා පවත්නා ආයතන ඒකාබද්ධ කිරීමටද යෝජනා කරනවා.

## රාජ්‍ය සේවකයින් සඳහා සහන

රාජ්‍ය සේවකයින්ගේ විදුලි බිල්පත් වියදම් අඩු කිරීම සඳහා සූර්යබල විදුලි පහසුකම් ලබාදීමට විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

රාජ්‍ය සේවකයින්ගේ පත්වීම් හා ස්ථානමාරු ලබා දීමේදී තම ගම් ප්‍රදේශ අදාළ දිස්ත්‍රික්කයන් තුළට යොමු කිරීමටද යෝජනා කරනවා.

මාණ්ඩලික නොවන ශ්‍රේණිවල කාර්යාල රාජ්‍ය සේවකයින්ට රාජකාරි වේලාවෙන් පසු වෙනත් රැකියාවල නිරත වීමට අවසර දීමට හා විදේශ රැකියාවන්හි නිරත වීමට අපේක්ෂිත සේවකයින්ට වසර 2ක නිවාඩු ලබාදීමටද යෝජනා කරනවා.

රාජ්‍ය සේවකයින් සඳහා බැංකු මගින් ලබා දෙන නිවාස ණය හා අත්තිකාරම් අරමුදල් යටතේ දෙනු ලබන නිවාස දේපල ණය සඳහා උපරිම පොලී අනුපාතය සියයට 7 දක්වා අඩු කිරීමට යෝජනා කරනවා.

## සුළු හා මධ්‍යම පරිමාණ අපනයනය දිරිගැන්වීමේ වැඩපිළිවෙළ (TIEP Scheme)

සෘජු හා වක්‍ර අපනයනකරුවන්ගේ අපනයන නිෂ්පාදන සඳහා රට තුළින් ලබාගත නොහැකි අමුද්‍රව්‍ය, අමතර කොටස්, සැකසුම් හා ඇසුරුම් ද්‍රව්‍ය (Processing and Packing Materials), ලේබල්, ස්ටිකර්ස්, catalogues and barouches ආදිය සඳහා ආනයනය කිරීමේ තාවකාලික පහසුකම් ලබාදී, දේශීය යෙදවුම් වලට ඉහළ අගයක් එකතු කිරීම තුළින් ප්‍රමිතියෙන් උසස් භාණ්ඩ අපනයනය කිරීමට TIEP යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනවා. අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව විසින් සුළු හා මධ්‍යම පරිමාණ අපනයනකරුවන් සඳහා පිහිටුවන විශේෂ අපනයන පහසුකම් මධ්‍යස්ථානය (Export facilitation Center) මගින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර ආනයන අපනයන ප්‍රකාශ ඇතුළු සියළු ලියකියවිලි මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදු කරනවා.

අපනයනකරුවන්ගේ අපනයන ලැබීම් සහතික කිරීම මගින් මූල්‍ය පහසුකම් ලබාගැනීම කඩිනම් කිරීම සඳහා අපනයන ආදායමෙන් සියයට 1ක රක්ෂණ වාරිකයක් සහිත රක්ෂණ ක්‍රමයක් අපනයන ණය රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා.

## පරිසරය

එක්වරක් භාවිතාකර ඉවතලන (single use) පොලිතීන් හා ප්ලාස්ටික් නිෂ්පාදන වලින් පරිසරයට සිදුවන හානී අවම කළ යුතුයි. වීදුරු හා පරිසර හිතකාමී සෞඛ්‍යාරක්ෂිත

අමුද්‍රව්‍ය හා දිරාපත්වන අමුද්‍රව්‍ය භාවිතය වැඩි කිරීම සඳහා ප්ලාස්ටික් නිෂ්පාදනය ප්‍රතිචක්‍රීකරණය අනිවාර්ය විය යුතුයි. පොලිතීන් හා ප්ලාස්ටික් කළමනාකරණය පරිසර සංවේදීව ඉටුකිරීම සඳහා ඉවතලද පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීමට එක්වරක් භාවිතකර ඉවතලන (single use) පොලිතීන් හා ප්ලාස්ටික් නිෂ්පාදන 2021.01.01 දින සිට තහනම් කිරීමට, යෝජනා කරනවා.

**"සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන"**

සුරකිමු ගංගා ජාතික පාරිසරික සංරක්ෂණය රට තුළ පවතින ස්වභාවික ගංගා ද්‍රෝණි 103ක ඇති ජල සම්පත, වාරිමාර්ග, පානීය ජලය, විදුලිබල ජනනය, සංචාරක කර්මාන්ත වැනි කාර්ය සඳහා යොදා ගනු ලබනවා. රටෙහි මුළු ජනගහනයෙන් සියයට 30කට වැඩි ප්‍රමාණයක් ගංගා ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශයන් ආශ්‍රිතව ජීවත් වෙනවා.

අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් මෙන්ම නාගරීකරණය හා කාර්මිකරණයත් නිසා රටෙහි ගංගා පද්ධතිය දූෂණය වෙමින් පවතිනවා. පොලීතින්, ප්ලාස්ටික්, මලඅපද්‍රව්‍ය බැහැර කිරීම්, කෘෂි රසායන ද්‍රව්‍ය මෙන්ම පාංශු ඛාදනය හේතුවෙන් ගංගා ජලයට අපද්‍රව්‍ය මුසුවීම පාරසරික තර්ජනයක් වී තිබෙනවා. එබැවින්, අවිධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීම් වැලැක්විමේ සහ නියමිත සංරක්ෂණ කොන්දේසින්ට අනුගත වූ විධිමත් ක්‍රමවේදයක් තුළ වැලි ගොඩදැමීම නියාමනය කිරීම සඳහා රුපියල් මිලියන 200ක අතිරේක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට යෝජනා කෙරේ.

**වන සංරක්ෂණය**

අක්කර 15,000ක කැලෑ වගාකිරීමේ වැඩසටහනට සමගාමීව මග දෙපස, පාසැල්, රජයේ හා පෞද්ගලික කාර්යාල භූමි හා තෝරා ගත් නාගරික ඉඩම්වල විවිධ පරිමාණයෙන් වන සනත්වය වැඩි කිරීම කඩිනම් කිරීමට යෝජනා කරනවා. නීති විරෝධි කැලෑ හෙලි කිරීම වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිරීක්ෂණ තර කිරීමටත්, දැනට හඳුනාගෙන ඇති විනාශයට ලක් වූ කැලෑ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහය ඇතුව නැවත වනාන්තර බවට පත් කිරීමටත් යෝජනා කරනවා. 2021-2023 තුන් අවුරුදු කාලසීමාව තුළ කඩිනම් වන වගා වැඩසටහන් දියත් කිරීම සඳහා මේ සඳහා රුපියල් මිලියන 3,500ක් වෙන් කිරීමටද යෝජනා කරනවා.

## ස්වයං රැකියා දායක විශ්‍රාම වැටුප් ක්‍රමය

රජයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක වුවත් ඇතැම් රාජ්‍ය සංස්ථා මෙන්ම පෞද්ගලික අංශය සඳහා ක්‍රියාත්මන වන්නේ සේවක අර්ථසාධක අරමුදලේ වරප්‍රසාද පමණයි.

මේ අතර කෘෂිකර්ම, ධීවර, කුඩා ව්‍යාපාර, ස්වයං රැකියා වැනි නිෂ්පාදන අංශවල හා සේවාවන්වල නියැලෙන්නන් මෙන්ම ඇඟළුම්, සංචාරක, වැවිලි, විදේශ රැකියාවල නිරතව විදේශ විනිමය උපයන අති බහුතරයකට විශ්‍රාම වැටුපක් හෝ සේවක අර්ථසාධක අරමුදල් ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම තුළ එම ජනතාවගේ සැදෑ සමය සඳහා ස්ථිර ආදායම් මාර්ග සීමා වී තිබෙනවා. එබැවින් ඔවුන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට 2012 දී මා යෝජනා කළා. ඒ අනුව, පොදු යහපත සඳහා වයස අවුරුදු 65 පසු විශ්‍රාම වැටුපකට හිමිකම ලබන දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා කරනවා.

## අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස

අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස කාන්තාවන් හා පිරිමින් වශයෙන් වෙන් කිරීම සාධාරණ නෑ. රාජ්‍ය අංශයේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 60ක් වන අතර පෞද්ගලික අංශය අවුරුදු 55ට සීමා කර තිබෙනවා. කාන්තාවන් සඳහා අඩු වයසක්ද ක්‍රියාත්මක වෙනවා එසේ වුවත් කාත්තාවන්ගේ ජීවිත අපෙක්ෂාව අවුරුදු 76.6 වන අතර පිරිමින්ගේ ජීවිත අපේක්ෂාව අවුරුදු 72ක් වෙනවා. එබැවින් පවත්නා ඉහළ ජීවිත අපේක්ෂා පාදක කරගෙන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ කාන්තා හා පිරිමින් සඳහා විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරනවා. සේවක අර්ථසාධක අරමුදල් පනත හඳුන්වා දෙන අවධියේ අපේ රටේ පිරිමින්ගේ ජීවිත අපේක්ෂාව අවුරුදු 58.8ක් හා කාන්තාවන්ගේ 57.5ක් පමණ අඩු වයසක් බව පෙන්වා දීමටද කැමතියි.

## සමෘද්ධි කාන්තා වෙළඳ ජාලය

සමෘද්ධි පවුල්වලින් තෝරාගත් තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000ක් ඉලක්ක කර ගනිමින් වෙළඳපළ ජාලය ප්‍රමාණවත් ලෙස ව්‍යාප්ත කොට ඇති සෑම ග්‍රාමසේවක

කොට්ඨාශයකටම වෙළඳසැලක් පිහිටුවීමට යෝජනා කරනවා. මෙම රාජ්‍ය අනුග්‍රහය හා බැංකු ණය පහසුකම් ලැබෙන වෙළඳසැල් ජාලය තුළ දේශීය නිෂ්පාදන අලෙවියට ප්‍රමුඛත්වය දෙනු ලබනවා. මෙම වෙළඳසැල් පිහිටුවීමට විවිධ අයුරින් දායකවන දේශීය ව්‍යවසායකයින්ට ඒ සඳහා කරනු ලබන වියදම් බදු ආදායමෙන් අඩු කිරීමට ප්‍රතිපාදන සලසනවා.

රජයේ දායකත්වය වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක අතිරේක ප්‍රතිපාදන ලබදීමටත්, සමෘද්ධි බැංකුව හා අනෙකුත් රාජ්‍ය බැංකු විසින් ණය පහසුකම් ලබාදීමටත්, භාණ්ඩාගාර ඇපකර හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් විශේෂ රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරනවා. සමූපකාර වෙළඳ ජාලය ශක්තිමත් කිරීම සඳහා සමූපකාර සංවර්ධන අරමුදලේ දායකත්වය ලබදීමටද යෝජනා කරනවා. සතොස හා ආහාර කොමසාරිස්වරයා සතු ගබඩා උපයෝගී කරගනිමින් තොග වෙළදාම හා බද්ධවී ලංකා සතොස සුපිරි වෙළඳ ජාලය නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල පුළුල් කිරීමටද යෝජනා කරනවා.

## ගමට පිළිසරණක්

"සෞභාග්‍යයේ දැක්ම" සැලසුම් කිරීමේදි මෙන්ම රජය පිහිටුවීමෙන් පසුවද අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් කෙරුණ "ගම සමග පිළිසඳරක්" ජනතා සංවාදය අතරතුර මේ රටේ පොදු ජනතාව සහනාධාර හෝ නොමිලේ කිසිවක් රජයෙන් ඉල්ලා සිටියේ නැහැ. ඔවුන් එක හඬින් ඉල්ලා සිටියේ සිය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ගමේ පාසැල ඉංග්‍රිසි, විද්‍යා, තාක්ෂණ, ක්‍රීඩා, ගුරුවරු, ලබාදන ලෙසයි. සිය මූලික අවශ්‍යතා සඳහා ගමේ රෝහල් සකස්කර දෙන ලෙස ඉල්ලා සිටියා. පාසැල් ක්‍රීඩාපිටි, සනීපාරක්ෂක පහසුකම් සකස් කර දෙන ලෙස දරුවන් හඩ නැගුවා. සිය දෛනික කටයුතු කර ගැනීමට මූලික වශයෙන් අවශ්‍ය ප්‍රමිතියෙන් යුතු පාරක් ගමට ලබා දෙන ලෙසයි. පානීය ජලය ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලා සිටියා. ස්වශක්තියෙන් සිය ජීවනෝපායන් වැඩිදියුණු කර ගැනීමට වැව් අමුණු, ඇළ වේලි සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියා. වන සතුන්ගෙන් තම දූ දරුවන්, දේපල ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටියා. මෙම යටිතල පහසුකම් මෙන්ම විදුලිය, සන්නිවේදන හා තාක්ෂණ පහසුකම් ගමට ගෙන එන ලෙසත් ඔවුන් ඉල්ලා සිටියා. වෙළඳපළ සඳහා සිය නිෂ්පාදන සෘජුව

ලබාදීමටත්, සිය ආර්ථික සමාජ කටයුතු සඳහා මුදල් පහසුවෙන් ලබා ගතහැකි ක්‍රමවේදයන් ඔවුන් ඉල්ලා සිටියා. මෙම අයවැයෙන් "ගම සමඟ පිළිසඳරින්" ගමට පිළිසරණක් වීමට මා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනවා.

1. "සැමට ජලය" රජයේ තුන් අවුරුදු ඉලක්කය ඉටුකර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ 200,000කට ආසන්න නිවාස ප්‍රමාණයකට නලජල සැපයුම් ලබාදීමට සමගාමීව ප්‍රජා පානීය ජල ව්‍යාපෘති, ජලාශ හා ජල මූලාශ්‍ර දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.
2. සෑම ගමක්ම ආවරණය වන පරිදි මාර්ග ලක්ෂයේ වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර 50,000ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 20,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.
3. දුෂ්කර ගම්මාන 12,000ක් අවට පරිසරය හා සම්බන්ධ කිරීම ඉලක්ක කර ගනිමින් කුඩා වාහන වලට ප්‍රවේශ විය හැකි ග්‍රාමීය පාලම් 10,000ක් ඉදිකිරීමේ වැඩසටහන කඩිනම් කිරීම සඳහා රුපියල් මිලියන 7,000ක් වෙන් කරනවා.
4. ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ව්‍යාප්ත කරනු ලබන ජාතික පාසැල් 1,000 වැඩසටහනට සමගාමීව අවට ඇති ග්‍රාමීය පාසැල්වල මූලික පහසුකම් වැඩි දියුණු කිරීම හා අවශ්‍ය ගුරුවරු අනුයුක්ත කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 3,000 වෙන් කරනවා.
5. ග්‍රාමීය රෝහල්, ඩිස්පෙන්සරි, මාතෘ සායන වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කරනවා.
6. ග්‍රාමීය පාසැල් ක්‍රීඩාපිටි, ග්‍රාමීය ක්‍රීඩා සංවිධාන, පාසැල් සිසුන් ක්‍රීඩා වලට යොමු කිරීම, ප්‍රාදේශීය ක්‍රීඩා සංවර්ධනය, වොලිබෝල් ක්‍රීඩාව හා කාන්තා ක්‍රීඩා සහභාගීත්වය පුළුල් කිරීමට අදාළ සංවර්ධන කටයුතු කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.
7. සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයන් හා ආශ්‍රිත ගම්මාන බලසම්පන්න කිරීම සඳහා රුපියල් මිලියන 10,000ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා.

8. සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත ගම්මානවලට සුවිශේෂිත වූ භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කරමින් වෙළඳපළ ආකර්ශණය කිරීම සඳහා රුපියල් මිලියන 2,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරනවා.
9. අලි මිනිස් ගැටුම් නිසා ඇතිවන ජීවිත හා දේපල හානි වලක්වා ගනිමින් ජනාවාස අරක්ෂා කර ගැනීම ඇතුළු ආරක්ෂන වැඩපිළිවෙළවල් ග්‍රාමීය ප්‍රජා දායකත්වයද ඇතිව බල ගැන්වීම සඳහා අලිවැට හා අගල් සකස් කිරීම, වනජීවි භූමිවල වැව් ගංගා හා ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කරනවා.
10. සංක්‍රමණික රටාවට බාධා නොවන පරිදි අභයභූමි හා වන අලීන්ගෙ සංක්‍රමණික මාර්ග හා ප්‍රදේශ සුරක්ෂිත කිරීමද එයට ඇතුලත් වෙනවා.
11. වනසතුන්ගෙන් අනාරක්ෂිත ගම්මානවල ධාන්‍ය සුරක්ෂිත ලෙස තබා ගැනීමට ග්‍රාමීය ගොවි හා ප්‍රජා සමිතිවලට බහාලුම් Container ලබා දෙනවා.
12. ඉවතලන කැලිකසල වනජීවී ප්‍රදේශ ආශ්‍රිත ප්‍රදේශවල දැමීම නිසා වනඅලින් ගම්වලට ආකර්ශණයවීම වලක්වාගැනීම සඳහා ප්‍රාදේශීය සභාවල කැලි කසල කළමනාකරණ සඳහා රුපියල් මිලියන 3,000ක ප්‍රතිපාදන සපයනවා.
13. ග්‍රාමීය පලාත්වල කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන සඳහා ණය සහතික කිරීමේ යෝජනා ක්‍රමය.
14. ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැති ප්‍රාදේශීය සභා වල මාර්ග නඩත්තු කිරීම, සතිපොළ හා පොදු ස්ථාන පවිත්‍රව තබා ගැනීම, අපද්‍රව්‍ය බැහැර කිරීම හා සනීපාරක්ෂක ප්‍රජා පහසුකම් පවත්වා ගැනීම ආදී කටයුතු සඳහා රුපියල් මිලියන 3,000ක ප්‍රතිපාදන වෙන් කෙරේ.

## කොළඹ වරාය නගර ආර්ථික කලාපය (Colombo Port City Special Economic Zone)

කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය ආකර්ශණීය ව්‍යාපාර මධ්‍යස්ථානයක් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුවෙමින් පවතිනවා. ප්‍රථම මූල්‍ය හා වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර තිබෙනවා. කොළඹ වරාය නගරයේ ප්‍රාථමික අදියරේ සංචාරක, විදේශ හා වාණිජමය කටයුතු 2021 වසර තුළ අරම්භ වීමට නියමිත වී තිබෙනවා. මෙම විශේෂ ආර්ථික කලාපය තුළ

වාණිජ සේවා ප්‍රවර්ධනයට සහ ආයෝජනයට හිතවාදී නව නීති රාමුවක් අයවැය විවාදයෙන් පසු ජනවාරි මස තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මා අපේක්ෂා කරනවා.

මෙම ආර්ථික කලාපයේ ශ්‍රී ලාංකිකයන් සඳහා පුළුල් රැකියා අවස්ථාවන් මෙන්ම ඔවුන්ට විදේශ මුදල්වලින් වැටුප් ගෙවීමටත් ප්‍රතිපාදන සලසා තිබෙනවා. ව්‍යාපාරික හා ආයෝජන හිතවාදී නීති රාමුවත්, යෝජිත උසස් යටිතල පහසුකමුත් හේතුවෙන්, ආයෝජකයන් හා ව්‍යාපාර ප්‍රජාව අතර ආසියාවේ ප්‍රමුඛ හා ආකර්ශණීය තේරීමක් බවට කොළඹ වරාය නගරය පත් වෙනවා ඇතැයි අප විශ්වාස කරනවා. අපේ රටේ ආයෝජන ප්‍රවර්ධනයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වන අතර ක්‍රමෝපාය ආයෝජන නීතිය යටතේ අවශ්‍ය බදු හා සුවිශේෂිත වූ භාණ්ඩ වෙළදාම, බැංකු හා විනිමය ගණුදෙණු සඳහා සහන ලබාදීමටද අපේක්ෂා කරනවා.

**සමාප්තිය**

ගරු කතානායකතුමනි,

මෙම අයවැය කඩා වැටුණු ආර්ථිකයක් ඔසවා තැබීමට ඉදිරිපත් කරන සංවර්ධන අයවැයක්. එය "සෞභාග්‍යයේ දැක්ම" යතාර්ථයක් කරමින් සාර්ව ආර්ථික දැක්මක් තුළ සියළු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස්කළ අයවැයක්. ගෝලීය ආර්ථිකයක් තුළ තරඟකාරී දේශීය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා අපේ ව්‍යාපාරික ප්‍රජාවට හිමිකරන ලද විශේෂ ආයෝජන අවස්ථා රාශියක් විවෘත කරන අයවැයක්. දේශීය ආර්ථිකය තරඟකාරී ලෙස ගෝලීය ආර්ථිකයට පිවිසීම සඳහා ඉදිරි වසර 3 තුළ අපේ රටේ සෑම තරාතිරමක නිෂ්පාදකයින් මේ සඳහා කැපවිය යුතුයි.රාජ්‍ය සේවය එයට දිරි ගැන්විය යුතුයි.

බදු හෝ විනිමය පාලන නීති වලින් මිදීම සඳහා දේශීයව හෝ විදේශීයව සඟවා තබාගෙන ඇති මුදල් රටේ අභිවෘද්ධියට යොදන ලෙස එම ව්‍යාපාරිකයින්ගෙන්ද මම ඉල්ලා සිටිනවා. මෙම අයවැයෙන් සලසා ඇති ඕනෑම ආයෝජනයක් සඳහා එසේ මුදල් යොදවන ව්‍යාපාරිකයන්ට පිලිගත් දිවුරුම් ප්‍රකාශයක් සහිතව සියයට 1ක බදු

ගෙවීමකට යටත්ව බදු සමාවක් ලබාදීමට නීති ප්‍රතිපාදන යෙදීමටද බලාපොරොත්තු වෙනවා.

2021 සඳහා ඇස්තමේන්තු ගත රජයේ ආදායම රුපියල් බිලියන 1961ක් වෙනවා. රජයේ මුළු වියදම රුපියල් බිලියන. 3,525ක් වන බැවින් ආදායම් වියදම් පරතරය රුපියල් බිලියන. 1,564ක් වෙනවා. 2014දී ජාතික ආදායමෙන් සියයට 32.3ක්ව පැවති පෞද්ගලික ආයෝජන 2019 දි සියයට 27.6 දක්වා අඩු වී තිබීමත්, ඇණහිට තිබූ රටේ සංවර්ධන වේගය යලි ආරම්භ කිරීමට රජය ශක්තිමත් ආරම්භයක් දිය යුතු නිසාත් 2021දී ජාතික ආදායමෙන් සියයට 9කට තරමක් අඩු අයවැය හිඟයක් පවත්වා ගැනීමට සැලසුම් කර තිබෙනවා.

දේශීය හා විදේශීය ගෙවීම් වලදී කල් පිරුණ ණය දිගුකාලීන ණය වශයෙන් නැවත නිකුත් කිරීමට ඇති අවස්ථාවන් පුළුල් වී ඇති නිසා මෙම අයවැය පරතරය කළමනාකරණය කර ගත හැකි බව මගේ විශ්වාසයයි. ඉතා පහළ මට්ටමක පවතින ආර්ථික ධාරිතා උපයෝජනය වැඩිකර ගැනීම මෙම අයවැය මගින් ඉදිරිපත් කර ඇති ග්‍රාමීය මෙන්ම නාගරිකත්, සම්ප්‍රදායික මෙන්ම තාක්ෂණික වශයෙනුත්, ක්ෂුද්‍ර මූල්‍ය මෙන්ම ප්‍රාග්ධන වෙළඳපළ වශයෙනුත් එකිනෙක ගැලපෙන සංවර්ධන යෝජනා මගින් හැකි වෙනවා. 2021 අපේක්ෂිත ආර්ථික වර්ධනය සියයට 5.5ක් වන අතර එය සියයට 6 ඉක්මවන වර්ධන වේගයකට යොමු කිරීමත් සමඟ රාජ්‍ය ආදායම් වර්ධනය දැනට පවත්නා සියයට 9.7 සිට සියයට 14.1 දක්වා ඉහළ නංවා ගැනීම සිදු කිරීම අපගේ අයවැය පරතරය අඩු කිරීමේ මැදි කාලීන දැක්ම බව අවධාරණය කරනවා. 2025 වන විට අයවැය හිඟය සියයට 4කට ඉලක්ක කර ඇත්තේ ආර්ථික ප්‍රසාරණය තුළින් පුළුල් කරන බදු ආදායම වර්ධනත්, රාජ්‍ය වියදම් හා රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණය සඳහා වැඩි විශ්වාසයක් තබා ඇති නිසාත්ය. ආර්ථික පුනර්ජීවනය සමඟින් දිළිඳුකම පිටුදැකීමේ සංවර්ධන අයවැයට ඔබ සියළු දෙනාගේ ආශිර්වාදය මා ඉල්ලා සිටිනවා.

ඔබ සැමට තෙරුවන් සරණයි!

## අයවැය සාරාංශය (2020- 2021)

*රු. බිලියන*

| අයිතමය | 2020 ඇස්තමේන්තුව | 2021 අයවැය |
|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන** | **1,588** | **2,029** |
| **මුළු ආදායම** | **1,580** | **2,019** |
| **බදු ආදායම** | **1,358** | **1,724** |
| ආදායම් බදු | 324 | 371 |
| භාණ්ඩ හා සේවා මත බදු | 631 | 823 |
| විදේශ වෙළඳාම මත බදු | 403 | 530 |
| **බදු නොවන ආදායම** | **162** | **227** |
| **පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම්ද ඇතුළත්ය)** | **60** | **68** |
| **ප්‍රදාන** | **8** | **10** |
| **මුළු වියදම්** | **2,854** | **3,594** |
| **වර්තන වියදම්** | **2,445** | **2,534** |
| වැටුප් හා වේතන (පළාත් සභාද ඇතුළත්ව) | 846 | 905 |
| වෙනත් භාණ්ඩ හා සේවා (පළාත් සභා ද ඇතුළත්ව) | 172 | 188 |
| පොළී ගෙවීම් | 866 | 860 |
| සහනාධාර හා පැවරුම් | 561 | 581 |
| **රාජ්‍ය ආයෝජන** | **419** | **1,070** |
| **අනෙකුත්** | **(10)** | **(10)** |
| **ඌන උපයෝජනය** | | ***13*** |
| **ආදායම් අතිරික්තය (+) හිඟය(-)** | **(865)** | **(515)** |
| **ප්‍රාථමික අතිරික්තය (+) හිඟය(-)** | **(400)** | **(705)** |
| **අයවැය අතිරික්තය (+) හිඟය (-)** | **(1,266)** | **(1,565)** |
| **මුළු මූල්‍යනය** | **1,266** | **1,565** |
| **මුළු විදේශ මූල්‍යනය** | **(225)** | **99** |
| දළ දේශීය ණය ගැනීම් | 325 | 606 |
| ව්‍යාපෘති හා වැඩසටහන් ණය | 128 | 342 |
| විදේශීය වාණිජ ණය | 197 | 264 |
| ණය ආපසු ගෙවීම් | (550) | (507) |
| **මුළු දේශීය මූල්‍යනය** | **1,491** | **1,466** |
| බැංකු නොවන මූල්‍යනය | 1,106 | 1,086 |
| ශ්‍රීලංකා සංවර්ධන බැඳුම්කර | (78) | 60 |
| බැංකු ණය ගැනීම් | 464 | 319 |
| **මුළු ආදායම හා ප්‍රදාන /ද.දේ.නි (%)** | **9.9** | **11.5** |
| **මුළු ආදායම /ද.දේ.නි (%)** | **9.9** | **11.4** |
| බදු ආදායම /ද.දේ.නි (%) | 8.5 | 9.8 |
| බදු නොවන ආදායම /ද.දේ.නි (%) | 1.0 | 1.3 |
| පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම්ද ඇතුළත්ය)/ද.දේ.නි (%) | 0.4 | 0.4 |
| **ප්‍රදාන /.ද.දේ.නි (%)** | **0.05** | **0.06** |
| **මුළු වියදම/ද.දේ.නි (%)** | **17.8** | **20.4** |
| වර්තන වියදම/ද.දේ.නි(%) | 15.3 | 14.4 |
| පොළී නොවන /ද.දේ.නි (%) | 9.9 | 9.5 |
| පොළී /ද.දේ.නි (%) | 5.4 | 4.9 |
| රාජ්‍ය ආයෝජන /ද.දේ.නි (%) | 2.6 | 6.1 |
| ආදායම් අතිරික්තය (+) හිඟය(-) /ද.දේ.නි(%) | (5.4) | (2.9) |
| ප්‍රාථමික අතිරික්තය (+) හිඟය(-) /ද.දේ.නි(%) | (2.5) | (4.0) |
| **අයවැය අතිරික්තය (+) හිඟය (-) /ද.දේ.නි(%)** | **(7.9)** | **(8.9)** |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකසන ලදී.*

**දළ ණය ගැනීමේ අවශ්‍යතාවය - 2021**
**(ගිණුම්කරණ කටයුතු සඳහා ප්‍රතිපාදන)**

| අයිතමය | රු. බිලියන |
|---|---|
| රාජ්‍ය ණය ගැනීම් හැර මුළු ලැබීම් | 1,994 |
| ණය ආපසුගෙවීම් ඇතුළුව මුළු ගෙවීම් | 4,808 |
| අත්තිකාරම් ගිණුම් සඳහා ප්‍රතිපාදන | 6 |
| දේශීය ණය සුරැකුම්පත්වල පොත්/මුදල් අගය සඳහා ගැලපුම් | 117 |
| අවදානම් වෙන් කිරීම | 60 |
| රාජ්‍ය ගිණුම් අනුව මුළු ණය ගැනීම් අවශ්‍යතාවය | 2,997 |
| එයින් මුළු ණය ආපසු ගෙවීම් | 1,257 |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*

**වියදම් යෝජනා**

| | | රු . මි. |
|---|---|---|
| 1 | ජාතික ආරක්ෂාව | 20,000 |
| 2 | රණවිරු වැඩසටහන් | 750 |
| 3 | මහජන ආරක්ෂාව | 2,500 |
| 4 | තාක්ෂණ ක්ෂේත්‍රය පුළුල් කිරීම | 8,000 |
| 5 | තාක්ෂණ උද්‍යාන | 10,000 |
| 6 | ළදරු හා ගැබිණි මව්වරුන් | 1,500 |
| 7 | ජනතා කේන්ද්‍රීය සෞඛ්‍ය සේවය | 10,000 |
| 8 | දුරස්ථ අධ්‍යාපනය | 3,000 |
| 9 | වෘත්තීය අධ්‍යාපනය | 3,000 |
| 10 | විශ්වවිද්‍යාල පහසුකම් | 1,000 |
| 11 | ක්‍රීඩා ආර්ථිකයක් | 2,000 |
| 12 | නාගරික ඇවිදින මං තීරු හා ප්‍රජා පොදු පහසුකම් | 2,000 |
| 13 | ග්‍රාමීය ක්‍රීඩා සංවර්ධනය | 3,000 |
| 14 | පුරාවිද්‍යා හා සංස්කෘතික උරුමයන් | 50 |
| 15 | ධීවර සංස්ථාව | 500 |
| 16 | දේශීය ධීවර කර්මාන්තය | 150 |
| 17 | මත්ස්‍ය ගොවිපල සංවර්ධන | 200 |
| 18 | වැවිලි ක්ෂේත්‍රය | 2,000 |
| 19 | බිංදු ජල සම්පාදනය | 1,500 |
| 20 | ග්‍රාමීය විදුලිකරණය | 750 |
| 21 | වැව් ප්‍රතිසංස්කරණය | 1,000 |
| 22 | ඛනිජ වැලි අනන්‍යතාවය ලියාපදිංචි කිරීම | 2,000 |
| 23 | විදේශ ආර්ථික සබඳතා | 750 |
| 24 | නීති ක්ෂත්‍රයේ පහසුකම් ප්‍රවර්ධනය | 6,000 |
| 25 | සුරකිමු ගංගා වැඩසටහන | 200 |
| 26 | වන සංරක්ෂණ | 3,500 |
| 27 | තරුණ කාන්තා ව්‍යවසායකත්වය | 1,000 |
| 28 | පානීය ජලය | 5,000 |
| 29 | මාර්ග ලක්ෂයේ වැඩපිළිවෙල | 20,000 |
| 30 | ග්‍රාමීය පාසැල් වැඩි දියුණු කිරීම | 3,000 |
| 31 | ග්‍රාමීය රෝහල් සංවර්ධනය | 5,000 |
| 32 | සමෘද්ධි පවුල් සවිබල ගැන්වීම | 10,000 |
| 33 | සාම්ප්‍රදායික ගම්මාන දියුණු කිරීම | 2,000 |
| 34 | අලි මිනිස් ගැටුම් පාලනය | 3,000 |
| 35 | අපද්‍රව්‍ය කළමනාකරණය - ප්‍රාදේශීය සභා | 3,000 |
| 36 | ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් | 3,000 |

අයවැය ඇස්තමේන්තුව සඳහා 10% ක ඌන උපයෝජනයක් සැලකිල්ලට ගෙන ඇත

## තාක්ෂණික සටහන්

## අයවැය 2021 – බදුකරණය

### 1. ආදායම් බද්ද (2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන)

**1.1 රඳවා ගැනීමේ බදු (ර.ගැ.බ.) ඉවත් කිරීම**

2020 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ගෙවීම් රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කර ඇත.

(i) වාසික තැනැත්තන්ට සිදු කරන පොළී ගෙවීම්, නිශ්චිත ගාස්තු, ලාභාංශ, ගාස්තු, ස්වභාවික සම්පත් ගෙවීම්, කුළී, රාජ්‍ය භාග, වාරික හෝ විශ්‍රාම ගෙවීම්.

(ii) සේවා නියුක්ති ආදායම.

(iii) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ ලාභ කොටස්.

හවුල් ව්‍යාපාරයක වාර්ෂිකව රුපියල් මිලියනයක් ඉක්මවන බදු අයකළ හැකි ආදායම, 6% ක හවුල් ව්‍යාපාර බද්දට යටත් වේ.

**1.2 ආදායම් බද්දෙන් නිදහස් කිරීම්**

(i) 2019 අප්‍රේල් 1 වන දින සිට කෘෂිකාර්මික, පශු සම්පත් සහ මත්ස්‍ය වගාව ඇතුළුව වගා ව්‍යාපාර තුළින් උපයන ලාභ සහ ආදායම්.

(ii) 2020 ජනවාරි 1 වන දින සිට තොරතුරු තාක්ෂණ සැපයීම් හා සඵල සේවා තුළින් උපයන ලාභ හා ආදායම්. මුදල් විෂය භාර අමාත්‍යතුමා විසින් රෙගුලාසි මගින් සඵල සේවා නිශ්චිතව දක්වනු ඇත.

(iii) 2020 ජනවාරි 1 වන දින සිට විදේශීය මූලාශ්‍ර වලින් උපයන ආදායමද ඇතුළුව ලංකාවෙන් පිටත පුද්ගලයන්ට ලබාදෙන සේවා මගින් උපයන ලාභ හා ආදායම, එකී සේවා සඳහා වන ගෙවීම් හෝ එකී ආදායම බැංකු හරහා විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන්නේ නම්.

(iv) 2020 ජනවාරි 1 වන දින සිට අනේවාසික (NRFC) සහ නේවාසික (RFC) විදේශ ව්‍යවහාර ගිණුම් සඳහා ලැබෙන පොලී ආදායම.

(v) 2018 අප්‍රේල් 1 වන දින සිට ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයෙකුගෙන් ලබාගෙන ඇති ණය මත සිදුකරන පොලී ගෙවීම්.

(vi) 2018 අප්‍රේල් 1 වන දින සිට විදේශීය හෝ දේශීය ව්‍යවහාර මුදල්වලින් වටිනාකම නියම කර ඇතී ඕනෑම ස්වෛරී බැඳුම්කරයක් මත නිර්වාසික පුද්ගලයෙකු උපයන ආදායම්.

(vii) 2018 අප්‍රේල් 1 වන දින සිට විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැඳුම්කර මත ඕනෑම පුද්ගලයෙකු ලබන පොළී හෝ වට්ටම්.

(viii) 2018 අප්‍රේල් 1 වන දින සිට රාජ්‍ය සංස්ථාවකට ලැබෙන, ඒකාබද්ධ අරමුදලින් හෝ රජය විසින් සැලසුම් කරන ණය මුදලකින්, පාර්ලිමේන්තුව විසින් වෙන්කරනු ලබන අරමුදල්.

(ix) 2020 ජනවාරි 1 වන දින සිට දේශීය සමාගමක් විසින් නිර්වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන ලාභාංශ.

(x) 2020 ජනවාරි 1 වන දින සිට වාණිජ කේන්ද්‍රස්ථාන ව්‍යාපාර විසින් කරන ලාභාංශ බෙදාහැරීම්.

(xi) 2020 ජනවාරි 1 වන දින සිට ඕනෑම තැනැත්තෙකුට යම් නිර්වාසික සමාගමක හරවත් සහභාගිත්වය සම්බන්ධයෙන් එම නිර්වාසික සමාගමෙන් ලැබුණු ලාභාංශ සහ කොටස් උපලබ්ධිවීමෙන් ලබන ලැබීම්

(xii) 2020 ජනවාරි 1 වන දින සිට රසායනාගාර සේවා හෝ තත්ත්ව සහතික ලබා දීමේ සේවා මගින් නිර්වාසික තැනැත්තෙකු විසින් උපයන මුදල්.

(xiii) 2020 ජනවාරි 1 වන දින සිට ප්‍රදාන හෝ පරිත්‍යාග ලෙස යම් ආගමික ස්ථානයකට ලැබෙන මුදල්.

(xiv) 2018 අප්‍රේල් 1 වන දින සිට ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් කරනු ලබන සියලුම ගුවන්යානා සම්බන්ධ ගෙවීම්, මෘදුකාංග බලපත්‍ර සහ අනෙකුත් විදේශීය ගෙවීම්

(xv) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් නිදහස් කිරීම් හෝ අනෙකුත් විධිවිධාන සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ කරගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම

**1.3 සුදුසුකම් ලබන ගෙවීම්**

(i) 2020 ජනවාරි 1 වන දින සිට සෑම තක්සේරු වර්ෂයක් සඳහාම වාසික හෝ නිර්වාසික එහෙත් පුරවැසියන් වන පුද්ගලයන් හට හිමි පුද්ගල සහනය රු. 3,000,000/-.

(ii) 2019 අප්‍රේල් 1 වන දින සිට ඕනෑම රාජ්‍ය සංස්ථාවක් මගින් ඒකාබද්ධ අරමුදලට සිදුකරන ගෙවීම් එම සංස්ථාවේ ආදායම් බදු ගණනය කිරීමේදී අඩු කළ හැක.

(iii) 2020 ජනවාරි 1 වන දින සිට මාසික රු. 100,000/- ක උපරිමයකට හෝ වාර්ෂිකව රු. මිලියන 1.2ක උපරිමයකට යටත්ව පහත ගෙවීම් පුද්ගලික ආදායම් බදු ගණනය කිරීමේදී අඩු කළ හැක.

- වෛද්‍ය රක්ෂණ සඳහා දායකත්වයද ඇතුළත් සෞඛ්‍ය වියදම්
- දේශීයව සිදු කළ අධ්‍යාපන වියදම්
- නිවාස ණය මත පොලී ගෙවීම්
- අනුමත විශ්‍රාම යෝජනා ක්‍රමයකට සිදු කරන දායකත්වය
- ස්කන්ධ හෝ සුරැකුම් මිලදී ගැනීම සඳහා දරන වියදම්

**1.4 ආදායම් බදු අනුප්‍රමාණ වෙනස්වීම්**

(i) 2020 ජනවාරි 1 වන දින සිට පුද්ගල ආදායම මත අදාළ වන බදු අනුප්‍රමාණ පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

- පළමු රු. මිලියන 3 - 6%
- ඊළඟ රු. මිලියන 3 - 12%
- ඉතිරිය - 18%

(ii) 2020 ජනවාරි 1 සිට සේවාන්ත ප්‍රතිලාභ මත අදාල වන ආදායම් බදු අනුප්‍රමාණ පහත පරිදි සංශෝධනය වේ.

- පළමු රු. මිලියන 10 - නිදහස්
- ඊළඟ රු. මිලියන 10 - 6%
- ඉතිරිය - 12%

(iii) නිර්වාසික පුද්ගලයින්ට කරන ගෙවීම්, එකී ගෙවීම් ශ්‍රී ලංකවේ මූලාශ්‍රයක් සහිත වන්නේ නම්, අවසාන රඳවාගැනීමේ ගෙවීම් ලෙස සැලකෙන අතර එම ගෙවීම් 2020 ජනවාරි 1 වන දින සිට පහත පරිදි බද්දට යටත් වේ.

- පොළී ගෙවීම් - 5%
- අනෙකුත් ගෙවීම් - 14%

(iv) 2020 ජනවාරි 1 වන දින සිට සංස්ථාපිත ආදායම් බදු අනුපාතය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

- අපනයන, සංචාරක, අධ්‍යාපන, සෞඛ්‍ය සේවා, ඉදිකිරීම් හා කෘෂි සැකසුම් 14%
- නිෂ්පාදන 18%
- වෙළඳ, බැංකු, මූල්‍ය, රක්ෂණ, අනෙකුත් (සම්මත අනුපාතය) 24%
- මත්පැන්, දුම්කොළ, ඔට්ටු හා සූදු බදු 40%

**1.5 අත්තිකාරම් ආදායම් බදු**

(i) 2020 අප්‍රේල් 1 වන දින සිට ගෙවීම් ලබන්නා විසින් ලිඛිතව සිය කැමැත්ත ප්‍රකාශ කර ඇත්නම් සාමාන්‍ය ස්ථාවර ආදායම් මූලාශ්‍ර (සේවා නියුක්ති ආදායම, පොළී ආදායම යනාදී) වලින් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩු කළ හැකි වේ.

(ii) 2020 අප්‍රේල් 1 වන දින සිට ගෙවීම් ලබන්නා විසින් ලිඛිතව සිය කැමැත්ත ප්‍රකාශ කර ඇත්නම්, ආදායම් ප්‍රභවයේදී අත්තිකරම් ආදායම් බද්ද අඩු කරනු ලැබේ.

**1.6 පශ්චාත් කොවිඩ් - 19 ආර්ථිකය පුනර්ජීවනය සඳහා වූ බදු සහන ක්‍රියාමාර්ග**

(i) ආයෝජන මණ්ඩලයේ සමාගම් විසින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය යන ආයතනයන්හි ඉල්ලීම මත සපයන සෞඛ්‍ය ආරක්ෂණ ඇඳුම් කට්ටල සහ ඒ හා සමාන නිෂ්පාදන තුළින් උපයන ආදායම් "අපනයන සේ සලකනු ලබන අපනයනයන්" (deemed exports) වශයෙන් සැලකීම සහ එම ප්‍රමාණය සැපයුම්කාර සමාගම් විසින් එළඹ ඇති ගිවිසුම් වල දක්වන 80%ක් වන අපනයන අවශ්‍යතාවය යටතේ සැලකීම සහ බදු අය කිරීම් වලට අදාල කටයුතු වලදී අඩු බදු ප්‍රතිශතයන් අදාල කර ගැනීම.

(ii) ආදායම ප්‍රකාශ කිරීමේදී හෝ යම් අඩු කිරීමක් හෝ සහනයක් ඉල්ලා සිටීමේදී වංචාවක් හෝ චේතනාන්විත පැහැර හැරීමක් සිදු වී නොමැති බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සෑහීමකට පත්වන්නේ නම්, 2018/2019 තක්සේරු වර්ෂය දක්වා ඔහු විසින් නිකුත් කරන ලද තක්සේරු මත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විසින් ගෙවියයුතු හිඟ ආදායම් බද්ද නිදහස් කිරීම.

(iii) 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර, එම වාර්ථාවේ ප්‍රකාශිත බද්ද ගෙවා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විසින් ඉදිරිපත් කරන එම ආදායම් බදු වාර්තා පිළිගැනිම සහ එම වර්ෂය සඳහා එම බදු ගෙවන්නන් මත අතිරේක තක්සේරු නිකුත් නොකිරීම.

(iv) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලෙගසි අංශය, හිඟ බදු අයකර ගැනීමේ අංශය සහ ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධති (RAMIS) අංශය සමඟ එකඟ වූ හිඟ/පැහැරහැර ඇති බදු ගෙවීම සඳහා සහන කාලයක් ප්‍රදානය කිරීමට යෝජනා කෙරේ.

(v) 2020 මාර්තු 1 වන දින සිට 2020 ජූනි දක්වා කාලය තුළ කළ යුතුව ඇති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන යම් බද්දක් ගෙවීම හෝ /සහ බදු වාර්තා ලබාදීම් 2020 දෙසැම්බර් 31 හෝ එදිනට පෙර සිදු කරයි නම් එය නියමිත දිනට කල ගෙවීමක් හෝ/සහ බාරදීමක් ලෙස සැලකීමට යෝජනා කෙරේ.

**2. එකතු කළ අගය මත බදු (වැට් ) (2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට සංශෝධන)**

i. 2020 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමේ සීමාව වන කාර්තුවකට රු. මිලියන 3 හෝ වසරකට රු. මිලියන 12 සිට කාර්තුවකට රු. මිලියන 75 හෝ වසරකට රු. මිලියන 300 දක්වා වැඩි කිරීම.

ii. බද්දට යටත් ක්‍රියාකාරකමක් කරගෙන යන යම් තැනැත්තෙකු විසින් ලිඛිතව ඉල්ලීමක් කර ඇත්නම් එම තැනැත්තාට එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමේ සීමාව නොසලකා එකතු කළ අගය මත බද්දට ස්වේච්ඡාවෙන් ලියාපදිංචිවීම සඳහා ඉඩ සලසා දීම.

iii. 2019 දෙසැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීම නිදහස් කිරීම.

iv. 2020 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණය සහ සඵල සේවාවන් නිදහස් කිරීම.

v. 2019 දෙසැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සැපයීම හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම මත අයවන එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය 15% සිට 8% දක්වා අඩු කිරීම.

vi. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සංචාරක නියෝජිතයින් විසින් රට තුළට එන සංචාර හා සම්බන්ධ සේවා සැපයීම 2020 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.

vii. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසිය යන ආයතනයන්හි ඉල්ලීම මත, 1978 අංක 4 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන සමාගම් විසින් ආධාර/සැපයුම් වශයෙන් ලබා දෙන සෞඛ්‍ය ආරක්ෂණ ඇඳුම් කට්ටල හා ඒ හා සමාන නිෂ්පාදන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.

viii. කොවිඩ් - 19 වසංගතයට පිළියමක් ලෙස සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ උපකරණ ඇතුළු යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම, ආනයනය කර සැපයීම හෝ ආනයනය කර පරිත්‍යාග කිරීම 2020 මැයි 20 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දින දක්වා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.

ix. ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම සහ එකතු කළ අගය මත බදු අනුපාතය අඩු කිරීමට සමගාමීව අපනයන අභිමුඛ ආයෝජන මණ්ඩල (BOI) සමාගම් විසින් ඇතැම් නිමි ඇඳුම් දේශීයව විකිණීමේදී අදාල වන ඒකක මත පදනම් වූ එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය රු. 100/- සිට රු. 25/- දක්වා අඩු කිරීම

x. එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමේ සීමාව ඉහළ දැමීම සහ ස්වේච්ඡාවෙන් ලියාපදිංචිවීම සඳහා ඉඩ සලසා දීමට සමගාමීව තොග හා සිල්ලර වෙළඳාම සඳහා හඳුන්වා දුන්, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් විසින් කරනු ලබන සැපයුම් එකතු කළ අගය මත බදු ඇතුලත් සැපයුම් ලෙස සැළකීම සඳහා වූ ප්‍රතිපාදන ඉවත් කිරීම.

## 3. තාක්ෂණික දෝෂ නිදොස් කිරීම.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යන පනත්වල ඇතැම් අපැහැදිලිකම් (පරිවර්තන වෙනස්කම් ද ඇතුළුව) නිදොස් කිරීම සඳහා සංශෝධනය සිදුකරනු ඇත.